අඛණ්ඩවම 15 වසරක් ජනප්‍රියතම මහජන සම්මානයෙන් පිදුම් ලද දිනපතා ජාතික පුවත්පත

# ලංකාදීප

31 වැනි කාණ්ඩය | 57 වැනි පත්‍රය | පිටු 20 යි | කොටස් 2 යි | විජය ප්‍රකාශනයක් | 2021 නොවැම්බර් මස 15 වැනිදා සඳුදා | අන්තර්ජාල ලිපිනය - www.lankadeepa.lk | මිල රුපියල් 30.00යි



## උහුලන්න බැරි තරමට රාජ්‍ය සේවය පුළුල් වෙලා

10 වැනි පිටුව බලන්න

## කුරුණෑගල මධ්‍යම වෙළෙඳපොළ

# කොන්ත්‍රාත්තුවේදී කෝටි 28 ක අත යට ගනුදෙනුවක්

## කෝපා කමිටුවේදී හෙළිවෙයි



ඉදිකරමින් පවතින කුරුණෑගල නව වෙළෙඳ සංකීර්ණය (ඡායාරූපය - පුෂ්පකුමාර ජයරත්න)

(සුජිත් හේවාජුලිගේ සහ අංජුල මහික වීරරත්න)

කුරුණෑගල මධ්‍යම වෙළෙඳපොළ ඉදිකිරීම සඳහා මහනගර සභාවේ ඉංජිනේරු ඇස්තමේන්තුවේ ඇස්තමේන්තු මුදල ඉක්මවා සියයට 41 ක් එනම් රුපියල් කෝටි 28 කට වැඩි මුදලක් ඉදිරිපත් කළ ලංසුකරුට කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේදී (කෝපා කමිටුව) තොරතුරු අනාවරණය වී ඇත.

6 වැනි පිටුවට

## බොර තෙල් නැතිව සපුගස්කන්ද වහයි

10 වැනි පිටුව බලන්න

### ගබඩාවල අවශ්‍ය තරම් තෙල් තියෙනවා-ඇමැති කියයි



## රාජ්‍ය කඨින මහෝත්සවයේදී ජනපති චීවරය වඩම්මවමින්...

රාජ්‍ය කඨින මහෝත්සවය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් කුරුණෑගල කොළඹගම ශ්‍රී මියුගුණාරාම රජමහා විහාරස්ථානයේදී ඊයේ (14) පෙරවරුවේ පැවැත්විණි. පඬු පෙවූ කඨින චීවරය මහා සංඝරත්නයට පූජා කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් වැඩම කරවනු ලැබූ අවස්ථාව මෙහි දැක්වේ. රාජ්‍ය අමාත්‍ය දයාසිරි ජයසේකර මහතා ද පසෙකින් සිටී.

## මුං ඇට කිලෝව රු. 225 ට සතොසෙන්



මුං ඇට කිලෝවක් රුපියල් 225ට සතොස වෙළෙඳසල් හරහා ලබන සතියේ සිට බෙදාහැරීමට කටයුතු කරන බව වෙළෙඳ අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා පාර්ලිමේන්තුවේදී පෙරේදා (13) පැවැසීය.

6 වැනි පිටුවට



## සමගි ජනබලවේගයේ හෙට කොළඹ විරෝධතාව නවත්වන්නේ නෑ

පක්ෂ මහලේකම් මද්දුම බණ්ඩාර

10 වැනි පිටුව බලන්න



## ආණ්ඩුවේ ගිවිසුම් තොරතුරු මැතිසබේට දීමට ව්‍යවස්ථාවෙන් බැඳීලා

රනිල්ගෙන් වරප්‍රසාද ප්‍රශ්නයක්

## දිල්ලි නගරය දුමාරයෙන් වැසේ: පාසල් වහයි

දිවාලි සැමරුම සඳහා විශාල වශයෙන් ගිනි කෙළි දැල්වීම සහ පිදුරු ගිනි තැබීම හේතුවෙන් ඉන්දියාවේ නවදිල්ලි අගනුවර මේ වන විට විෂ දුමාරයකින් වැසී පවතින බවත්, අගනුවර වායු දූෂණය අන් කවරදාටත් වඩා ඉහළ ගොස් ඇති බවත්, එරට මාධ්‍ය වාර්තා පෙන්වා දෙයි.

6 පිටුවට



## ඉල් මහ විරු සමරුවේදී...

ජනතා විමුක්ති පෙරමුණේ ඉල්මහ විරු සමරුව, පක්ෂයේ නායක අනුර කුමාර දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන්, බත්තරමුල්ල පැලවත්ත ප්‍රධාන කාර්යාලයේදී පෙරේදා (13 වැනිදා) පැවැත්විණි. එහිදී අනුර කුමාර දිසානායක මහතා ඇතුළු පක්ෂයේ නායකයන්, මියගිය නායකයන් සිහි කර පුෂ්පෝපහාර දැක්වූ අයුරු. පක්ෂයේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, දේශපාලන මණ්ඩල සභික කේ.ඩී. ලාල්කාන්ත යන මහත්වරු ද මෙහි වෙති.

### පණ්කජ රුවින්දගේ සරදම්



රාජ්‍ය සේවය බරක් බං !

එතකොට සැර් ෆේල් ඇමැතිවරු බරක් නෙවෙයිද ?

## උද්ඝෝෂණ සෞඛ්‍යයට ප්‍රශ්න ඇතිවිය හැකියි

පී.එච්.අයි. සංගම් සභාපති කියයි

10 වැනි පිටුව බලන්න

### මගේ විශ්‍රාම වැටුප කපා අයවැය පියවිය හැකිද?



## අයවැයට සහාය දෙනවාද? තීරණය මධ්‍යම කාරක සභාවෙන්

අටපිරිකර හා පූජා භාණ්ඩ ප්‍රමුඛයෝ

විශ්වාසවත්, පිරිසිදුවත්, විනයානුකූලව, අටපිරිකරක් ලබා ගැනීමට ලුම්බිණි ස්ටෝර්ස් වෙතම යන්න

ලුම්බිණි ස්ටෝර්ස්

දිවයිනේ කිසිම තැනක අපගේ ශාඛාවන් නොමැත

65, ඕල්කට් මාවත, පිටකොටුව 11. 23 24 814

ස්වෝත්සාහයෙන් නැගී සිටින දේශයේ ව්‍යවසායකයනට

SMIB අත්වැල

සරු පොළවක් සාරවත් වගාවක්

කාබනික පොහොර නිෂ්පාදනය සඳහා මූල්‍ය සහය

- රු. මිලියන 100 ක් දක්වා උපරිම ණය මුදලක්
- ආපසු ගෙවීම සඳහා උපරිම වසර 5ක්
- කාරක ප්‍රාග්ධනයට හා ස්ථාවර වත්කම් සඳහා මූල්‍ය පහසුකම්
- අවම හා සහනදායී ස්ථාවර පොලියක්
- අපේක්ෂිත කාලය තුළ ණය මුදල අතට
- සරල ඇප කොන්දේසි (එංචල හා නිශ්චල දේපළ ඇතුළත්ව)
- ව්‍යාපෘතියේ වටිනාකමින් 75% ක් දක්වා ණය මුදලක්
- ගෙවීම සඳහා සහන කාලය මාස 6ක් (Grace Period) ඇතුළුව පහසුකම් රැසක්

1922

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

State Mortgage & Investment Bank

ICRA (SL) BBB+

ඔබේ ගමන නවත්වන්න දියවැඩියාවට ඉඩදෙන්න එපා!

දියවැඩියා රෝගීන් සඳහාම වන ශ්‍රී ලංකාවේ එකම සෞඛ්‍යය හා ජීවිත රක්ෂණය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් Comprehensive D+

SLIC ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් පියකු මෙන් මවක මෙන්

0112 357 357

Company Registration Number - PB 289

# තෙමස් පූර්ණ පුණ්‍යානුමෝදනාවයි

**උපත: 1940.09.05**
**විපත: 2021.08.07**

**කරුණාමුනි පද්මා විජයසිංහ**

වස්කඩුව පොකුණුවත්ත පදිංචිව සිටි විශ්‍රාමික ගුරු කරුණාමුනි පද්මා විජයසිංහ අප මැණියන් වහන්සේ අභාවප්‍රාප්ත වී තෙමසක් පිරීම නිමිත්තෙන් එතුමිය පදිංචිව සිටි නිවසේදී 2021 නොවැම්බර් 16 අඟහරුවාදා සුමධුර ධර්ම දේශනාවක් ද පසුදින මහා සඟරුවන විෂයෙහි සංඝගත දක්ෂිණාවක් ද වත්මන් සෞඛ්‍ය නීතිරීති වලට අනුව පැවැත්වීමට කටයුතු යොදා ඇත.

**මෙපින් බෙලෙන් එතුමියට උතුම් නිර්වාණාවබෝධය වේවා!**

මීට ර්.එස්. සොයිසා (ස්වාමිපුරුෂයා), දුව, පුතා, බෑණා, ලේළිය සහෝදරයා සහ ඥාතිහිතමිත්‍රාදීන්





# තීරණ නොසැලී ක්‍රියාත්මක කරමු

**හෙට තවත් බියජනකයි. අපි සැලසුම් සහගතව මුහුණ දිය යුතු වෙමු. තීරණ නොසැලී ක්‍රියාත්මක කළ යුතුයි. අපට ජයගත හැක.**

කෝවිඩ් වසංගතයෙන් ලෝක බලවතුන්
මහා පරිමාණයෙන් කඩා
වැටෙද්දී,
අපට අඩියක් පසුපසට ගොස් නොවැටී සිටිය හැකි විය.
කෝවිඩ් වසංගතයෙන් ඇමරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය, ඉන්දියාව, ජර්මනිය, ප්‍රංශය, කුණුවෙද්දී
අපි පළමු වටයෙන් ලොව අංක 1වම අපේ රට බේරා ගතිමු.

2020 ඇමෙරිකානු ආර්ථිකය සියයට -9.7 කින් කඩා වැටෙද්දී,
බ්‍රිතාන්‍ය සියයට -22.5 කින්ද,
ඉන්දියාව සියයට -12.5 කින්ද,
කඩා වැටෙද්දී, අපේ රට සියයට -3.8 කින් බේරා ගැනීමට හැකිවිය.

ලෝක බැංකු පුරෝකථන අනුව මේ වසරේ ලෝක ආර්ථිකය සියයට -5.2 කින් කඩා වැටේ.
ඔවුන් කියන්නේ 1870 ට පසු සිදුවන ලොකුම ඒක පුද්ගල ආදායම කඩාවැටීමත් මේ වසරේ සිදුවන බවයි.

සංවර්ධිත රටවල සියයට7 කින්ද,
සංවර්ධනය වෙමින් පවතින රටවල සියයට2.5 කින්ද,
ඒක පුද්ගල ආදායම කඩා වැටේ.
U.N.O පුරෝකථන අනුව මේ වසරේ සංචාරක ව්‍යාපාරයට අමෙරිකානු ඩොලර් ට්‍රිලියන 1.2 ක පාඩුවක් සිදුවේ.
සංචාරක ව්‍යාපාරයේ රැකියා මිලියන 120 ක් නැතිවේ.
සංචාරක ව්‍යාපාරය සියයට 58 ත් සියයට 78 ත් අතර අඩුවේ.
පසුගිය මාස 6 යේ සංචාරක කර්මාන්තයේ ආදායම ඩොලර් බිලියන 320 කින් අඩුවී ඇත.
U.N.O කියන්නේ 2009 මහා ආර්ථික අවපාතය මෙන් 3 ගුණයක අවපාතයක් මෙවර සිදුවන බවයි.
සංචාරක ව්‍යාපාරය රටේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වී ඇති අප වගේ රටවල විරැකියා අනුපාතය සියයට20 ඉක්මවනු ඇත.

මැකින්සි ග්ලෝබල් උපදේශන හා පරීක්ෂණ ආයතනය කියන්නේ කෝවිඩ් බලපෑම උපකල්පිත ලෝක යුද්ධයකට වඩා දෙගුණයක් බවයි.
මැකන්සි පරීක්ෂණ ආයතනය කියන්නේ උපකල්පිත ලෝක යුද්ධයක හානිය ඩොලර් ට්‍රිලියන 15ක් බවයි.
කොරෝනා හානිය ඩොලර් ට්‍රිලියන 30 ක් බව ඔවුහු කියති.

බොස්ටන් ජාත්‍යන්තර උපදේශක සමාගම කියන්නේ, ඉදිරි මාස කිහිපය තුළ ලොව බිලියන2කට රැකියා අහිමි වන බවයි.

අද වනවිට ලෝකයේ කෝවිඩ් වැළඳුණ රෝගීන් ගණන මිලියන 244 කි.
ලෝකයේ සිදුවී ඇති මරණ මිලියන 5 කි.
ශ්‍රී ලංකාවේ රෝගීන් 533529 ක් වන අතර,
මරණ 13593 කි.
අද වන විට බොරතෙල් මිල ඩොලර් 83.27 කි.
වැඩිවීම සියයට 62.2 කි.
එල්.පී. ගෑස් මෙට්‍රික් ටොන් 1ක් ඩොලර් 797 කි.
වැඩිවීම සියයට74.4 කි.
ගල් අඟුරු මෙට්‍රික් ටොන් 1ක් ඩොලර් 281.33 කි.
වැඩිවීම සියයට 202.3 කි.
කිරිපිටි මෙට්‍රික් ටොන් 1ක මිල ඩොලර් 3749 කි.
වැඩිවීම 16.8% කි.

කෝවිඩ් වසංගතයත් සමග ලෝකයේ තෙල් ළිං, ගෑස් ළිං, ගල් අඟුරු ආකර ද, වැසී ගියේය.
ඒ සමග ලෝකයේ සෑම රටකම කර්මාන්ත ශාලාද, වැසී ගියේය.
ආහාර නිෂ්පාදනයද අඩපණ විය.
ඇඟලුම් කර්මාන්තයද ඇදවැටුණි.
රථවාහන, යන්ත්‍ර උපකරණ, වෛද්‍ය උපකරණ, මහා පරිමාණ නිෂ්පාදනවල කොටස් නිපදවන ලෝකයේ බොහෝ කර්මාන්ත ශාලාද වැසී ගියේය.

එසේම විවිධ රටවල සිටි පලපුරුදු විදේශීය, ඉංජිනේරුවෝ, කාර්මිකයෝ, ශිල්පියෝ, ලහි ලහියේ තම ගම් රටවල් බලා පිටත්වූහ.
එසේම බර වාහන රියැදුරෝ ලොරි රියැදුරෝ බස් රියැදුරෝ තම සේවා බිම් අතහැර ගම් රටවල් බලා ගියහ.

දැන්, ලෝකයේ සියලු රටවල ආහාර, රෙදිපිළි, කඩදාසි, සෙල්ලම් බඩු, ඇඳුම් පැළඳුම්, කොම්පියුටර් චිප්ස්, අයි ෆෝන් චිප්ස්, විශාල ලෙස හිඟ වී ඇත.
මේ අතර ගත වූ වසර තුළ ලෝකයේ ඇතැම් රටවලට බලපෑ නියඟ, තවත් රටවලට බලපෑ ගංවතුර, සුළි කුණාටු, නිසාද ලෝකයේ විශාල ආහාර හිඟයක්ද, ඇති වී ඇත.
දැන් අපි ශ්‍රී ලංකාව දෙසට හැරෙමු.
මේ වනවිට යකඩ මිල සියයට 200 කින් ඉහළ ගොස් ඇත.
වැලි, සිමෙන්ති, ගල් ද එසේමය.
තෙල්, ගෑස්, ගල් අඟුරු මිල තව තවත් ඉහළ යනු ඇත.
සියලු බෙහෙත් වර්ග සියයට 40-30 කින් වැඩි වී ඇත.
පිටි, සීනි, හාල් හා සියලු ධාන්‍ය වර්ග වේගයෙන් ඉහළ යාම රජයට නතර කළ නොහැක.
යූරියා මෙට්‍රික් ටොන් 1ක් ඩොලර් 260 සිට ඩොලර් 750 දක්වා වැඩි වී, දැන් ඩොලර් 1000 ද ඉක්මවා ඇත.

ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකය පුරා, මේ ආහාර හා භාණ්ඩ හිඟය, ඉදිරි මාස කිහිපය තුළ තව තවත් ඉහළ යනු ඇත.

හිඟවෙන තරමටම මේවායේ මිල ඉහළයාම කිසිවකුට නතර කළ නොහැක.
මේ ප්‍රශ්නවලට ජනාධිපතිවරයාවත්, රජයවත් වගකිවයුතු නැත.
වැඩිවන බඩු මිල රජය දරාගෙන අඩු මිලට භාණ්ඩ ලබා දීමටද ශ්‍රී ලංකා රජයට අද ශක්තියක් නැත.

රජයේ සියලු ප්‍රධාන ආදායම් මාර්ග අද කඩාවැටී ඇත.
එනිසා සියලු ජනතාවට මේ ඉහළ යන බඩු මිලට මෙන්ම, අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හිඟයට ඉවසීමෙන් මුහුණ දීමට සිදුවේ.

අපට ඉතිහාසයේ කවදාටත් වඩා වැඩියෙන් ඉදිරියේ සංචාරක කර්මාන්තය ශක්තිමත් කර ගැනීමට හැකි වනු ඇත.
ඇඟලුම් කර්මාන්තයෙන්ද ලෝකයේ අංක 1 ටම අපට පැමිණිය හැක.
ඒ සඳහා කළ යුතු ප්‍රධාන දෙය වන්නේ ඇඟලුම් කර්මාන්තය සේවකයන්ට ආකර්ෂණීය වීමටත්, ගෞරවණීය වීමටත්, පරිසරය ඇති කළ යුතුය.

අදටත් ශ්‍රී ලංකාව ලෝකයේ මිල ඉතා අධික ඇඳුම් පැළඳුම් නිෂ්පාදනය කරන්නා වෙයි.


අපේ අනිත් ප්‍රධාන ඩොලර් ආදායම වන විදේශගත අපේ නුපුහුණු ශ්‍රමිකයන් වෙනුවට, හැකි තරම් පුහුණු ශ්‍රමිකයන්, කාර්මිකයන්, ශිල්පීන් මෙන්ම, වැඩි වැඩියෙන් වෛද්‍යවරු, ඉංජිනේරුවන්, හෙදියන්, ගෘහ නිර්මාණ ශිල්පීන්, විද්‍යාඥයන් පිටරට යැවිය යුතුය.
මේ අය බිහිකර ගැනීම අපට ගැටලුවක් නොවේ.

ඒ සඳහා වැඩිවැඩියෙන් පෞද්ගලික විශ්වවිද්‍යාල, වෛද්‍ය විද්‍යාල, ශිල්පීය අධ්‍යාපන ආයතන රට තුළ ඇති කළ යුතුය.
සියලු විශ්වවිද්‍යාල විදේශ දරුවන්ටද විවෘත විය යුතුය.
මේ සඳහා රජය මුදල් වැය කළ යුතු නොවේ.

වැඩිකල් නොගොස් නැවත අපට ආසියාවේ වේගයෙන්ම සංවර්ධනය වන රට බවට පත්විය හැක.

අපි අපේ ඉලක්ක හඹා යා යුතුය.
තීරණ ක්‍රියාත්මක කළ යුතුය.
විරෝධතා මැඩපැවැත්විය යුතුය.
අපට ජයගත හැක.


## අවමංගල්‍ය ස්තුතිය



ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී

**ආර්.පී.එච්. අතුල බණ්ඩාර මහතා**

2021 නොවැම්බර් 03 වැනි දින අභාවප්‍රාප්ත වූ, ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී ආර්.පී.එච්. අතුල බණ්ඩාර මහතාගේ අභාවය වෙනුවෙන් වැඩම කළ ගරුතර මහා සංඝරත්නය හා අන්‍යාගමික පූජකතුමන්ලාටත් රෝහල් ගත වූ අවස්ථාවේ සිට අභාවයෙන් පසු අවසන් කටයුතු සිදු කළ අවස්ථාව දක්වා නන් අයුරින් උදව් උපකාර කරමින් අප හා ශෝකය බෙදාගත්, සීමා සහිත විජය පුවත්පත් සමාගමේ සභාපතිතුමා, ප්‍රධාන කර්තෘ තුමා ඇතුළු සියලුම කාර්ය මණ්ඩල මහත්ම මහත්මීන්ටත්, අනුරාධපුර, මහනුවර, උතුරු කොළඹ (රාගම) රෝහල්වල විශේෂඥ වෛද්‍යතුමන් ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයටත්, පැමිණි සහ ශෝක ප්‍රකාශ එවූ දේශපාලන අධිකාරියටත්, සියලුම විද්‍යුත්, මුද්‍රිත මාධ්‍ය ආයතන හා රට වටා සිටින මාධ්‍යවේදීන්ටත්, අනුරාධපුර හා මිහින්තලේ ඇතුළු අනුරාධපුර කොට්ඨාසයේ පොලිස් ස්ථානාධිපතිවරුන් ඇතුළු නිලධාරීන්ටත්, සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන නිලධාරීන්, සියලුම ප්‍රදේශවාසීන්, ඥාතීන් හා හිතමිතුරන්ටත් අපගේ ස්තුතිය පුදකර සිටිමු.

**මෙයට ශෝකයට පත්,**
- **එන්.ඒ. කාන්ති ප්‍රේමලතා (බිරිඳ)**
- **ආර්.පී.එච්. හසලි අනුත්තරා බණ්ඩාර (දියණිය)**
- **ආර්.පී.එච්. හසිත නිර්වාන බණ්ඩාර (පුතා)**
- **ආර්.පී.එච්. සුසිත හර්ෂණ බණ්ඩාර (පුතා)**



## වාහන විකිණීමට

**අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ්**

IDEAL Finance

නො.299, ආචාර්ය කොල්වින් ආර්.ද සිල්වා මාවත, යූනියන් පෙදෙස - කොළඹ 02

| වාහන අංකය | වර්ගය | මාදිලිය | වර්ෂය | ස්ථානය |
|---|---|---|---|---|
| CAY-5XXX | සුසුකි | Wagon-R | 2017 | කඩවත |
| 250-7XXX | ටොයෝටා | Hiace | 1993 | යාපනය |
| ND-6XXX | නිසාන් | Civilian | 2010 | කඩවත |
| LE-2XXX | Foton | Bj10 | 2007 | බණ්ඩාරවෙල |
| QL-6XXX | බජාජ් | 4 Stroke | 2007 | කඩවත |

**ටෙන්ඩර්පත් කැඳවීම 2021 නොවැම්බර් මස 22 වන දින අවසන් වේ.**

වාහන පරීක්ෂා කිරීම 2021 නොවැම්බර් මස 15 සිට 22 වන දින දක්වා සතියේ දිනවල පෙ.ව 9.00 සිට ප.ව 4.30 දක්වා.

ඕනෑම වාහනයක් කිසිඳු පූර්ව දැනුම් දීමකින් තොරව ඉවත් කිරීමේ අයිතිය අයිඩියල් ෆිනෑන්ස් සතුව ඇත.

කඩවත - චමත් - 0714 940 020 යාපනය - සුගන්තන් - 0714 940 021
බණ්ඩාරවෙල - නිලංග - 0718 64 33 35



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
**වාරිමාර්ග අමාත්‍යාංශය**

cecb

**ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය.**

## ටෙන්ඩර් කැඳවීම

### ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙනුවෙන් කණිෂ්ඨ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 415 ස්ථානයේ පිහිටි ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ, ප්‍රධාන කාර්යාලයේ ඇති ආපනශාලාව වසරක කාලයක් (මාස 12) පවත්වාගෙන යාම සඳහා මුද්‍රා තබන ලද මිළ ගණන් සහිත ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

1. අයදුම්කරුවන් අවම වශයෙන් අවුරුද්දක (1) පළපුරුදු හෝටල් හෝ ආපනශාලාකරුවන් විය යුතුය.
2. කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව 500 කට අධික වේ.
3. ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් සමඟ ලිඛිත ඉල්ලීමක් කිරීමෙන් හා ආපසු නොගෙවන **රු. 500/=** (රුපියල් පන්සීයක) මුදලින් **15. 11. 2021** දින සිට **02. 12. 2021** දින දක්වා **15.00 පැය** දක්වා කාලය තුළ බෞද්ධාලෝක මාවතේ, අංක 415 ස්ථානයේ පිහිටි ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ මුදල් අයකැමි වෙත මුදල් ගෙවූ රිසිට්පත් ඉදිරිපත් කිරීමෙන් පසු ප්‍රසම්පාදන නිළධාරී වෙතින් අදාල මිළ ගණන් පත්‍රිකාව ලබාගත හැක.
4. යථා පරිදි සම්පූර්ණ කළ මිළ ගණන් පත්‍රිකා පිටපත් දෙකක් වශයෙන්, පළපුරුද්ද පිළිබඳ සහතික, ලේඛන හා කාර්යාංශයට ගාස්තු ගෙවූ ලදුපතද ඇතුලත්ව, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන් හෝ ඉහත ලිපිනයේ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ කණිෂ්ඨ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලියාපදිංචි තැපෑලෙන් **03. 12. 2021 දින 14.00 පැයට** පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාදවී ලැබෙන ටෙන්ඩර් පත්‍රිකා ප්‍රතික්ෂේප කෙරේ. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ටෙන්ඩර්පත් විවෘත කරන අතර, එම අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැක.
5. ලංසු භාරගැනීම අවසන්කරනු ලබන දින සිට **03. 03. 2022** දක්වා ඉදිරිපත් කරන ලංසු වලංගු විය යුතුයි.
6. ඕනෑම මිළගණන් පත්‍රිකාවක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ කණිෂ්ඨ ප්‍රසම්පාදන කමිටුව සතුවේ.
7. අයදුම්පත බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ ආපනශාලා පවත්වාගෙන යෑම සඳහා මිළ ගණන් යනුවෙන් සඳහන් කළයුතුය.
8. තෝරාගන්නා ලද ආපනශාලා භාරකරු විසින් ආපනශාලාව ආරම්භ කිරීමට පෙර ආපසු ගෙවනු ලබන **රු. 25,000.00** ක ඇප තැන්පතු මුදලක් මෙම කාර්යාංශය වෙත මුදලින් තැන්පත් කළ යුතුය.
9. වැඩි විස්තර ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ ප්‍රසම්පාදන නිළධාරී මහතාගෙන් සාමාන්‍ය සතියේ රාජකාරි දින වලදී පැමිණ හෝ දුරකථන අංක 011-2668821 මගින් ලබාගත හැක.

**සභාපති,**
**කණිෂ්ඨ ප්‍රසම්පාදන කමිටුව,**
**ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය,**
**අංක 415, බෞද්ධාලෝක මාවත,**
**කොළඹ 07.**



## මහජනතාව වෙත කෙරෙන නිවේදනයයි!

**දේශපාලන පළිගැනීම් පිළිබඳ තොරතුරු ලබාගෙන පරීක්ෂාකර, විමර්ශනය කිරීම පිණිස සහ සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත්කළ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.**

2015 ජනවාරි මාසයේදී සහ අගෝස්තු මාසයේදී පැවති ජනාධිපතිවරණයට සහ / හෝ මහ මැතිවරණයට පෙර නිලතල දැරූ රජයේ නිලධරයන්, රාජ්‍ය සංස්ථාවල සේවකයන්, සන්නද්ධ හමුදාවන් සහ පොලිස් සේවයෙහි සාමාජිකයන්ට හෝ වෙනත් කිසියම් තැනැත්තකුට 2015 ජනවාරි මස (08) වන දිනෙන් ආරම්භ වී 2019 නොවැම්බර් මස (16) වන දිනෙන් අවසන්වූ කාල සීමාව තුළදී සෘජුව හෝ ව්‍යංගයෙන් සිදුවී ඇතැයි කියන දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂාකර තොරතුරු ලබාගෙන විමර්ශනය කිරීම සඳහා පත්කරන ලද විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ දැක්වෙන තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති කොමිෂන් සභාවක් අතිගරු ජනාධිපතිතුමා විසින් අංක 2212/53 හා 2021.01.29 දරන (සංශෝධිත) ගැසට් පත්‍රය මගින් පත් කරන ලදුව,

එකී කොමිෂන් සභා වාර්තාවේ නම් සඳහන් තැනැත්තන් සියල්ලම හෝ යම් කිසිවකුට අදාළව එකී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ තීරණ සහ නිර්දේශ සියල්ලම හෝ කිසිවක් යුක්ති සහගත වන්නේද යන්න සහ ඒවා කිසිවක් හෝ සියල්ලම ක්‍රියාත්මක කළ යුතුද, නැතහොත් ක්‍රියාත්මක කරලීමට සැලැස්විය යුතු ද. එසේ නැතහොත් අන්‍යාකාරයකින් තවදුරටත් කටයුතු කරගෙන යායුතුද යන්න පරීක්ෂා කිරීමට ජනාධිපතිතුමා විසින් තීරණය කර ඇති බැවින්, එකී කරුණු සම්බන්ධයෙන් තොරතුරු පරීක්ෂාකර, විමර්ශනය කිරීම සඳහා අංක 2212/53, 2021.01.29 වන දින දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් මෙම විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව පත් කර ඇත. එබැවින්,

I. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන උල්ලංඝණය කිරීම.
II. බලය අනිසි ලෙස පරිහරණය කිරීම හෝ බලය අයථා පරිදි පාවිච්චි කිරීම, මැදිහත් වීම, වංචා කිරීම, දූෂණය හෝ ඥාති සංග්‍රහය
III. යම් තැනැත්තෙකුගෙන් දේශපාලන වශයෙන් පළිගැනීම
IV. යම් තැනැත්තෙකුගේ -
   (අ) යම් පත්වීමක් ලබාදීමේදී හෝ මාරුවක් සිදු කිරීමේදී.
   (ආ) යම් උසස් වීමක් ලබා දීමේදී.
   (ඇ) සේවය අවසන් කිරීමේදී.
   යම් අක්‍රමිකතාවයක්
V. යම් ලිඛිත නීතියක් උල්ලංඝණය කිරීම.

සම්බන්ධයෙන් හෝ එකී වාර්තාවේ ඇතුළත් නිගමනයන්, තීරණයන් හා / හෝ නිර්දේශ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට අවශ්‍ය / බලාපොරොත්තු වන අය කොමිෂන් සභාව වෙත එකී කරුණු ලිඛිතව ඉදිරිපත් කරන ලෙස මෙම කොමිෂන් සභාව විසින් එකී වාර්තාවේ නම් සඳහන් පුද්ගලයන්ට මෙයින් ඇරයුම් කරනු ලැබේ. එසේ ඉදිරිපත් කරනු ලබන කරුණු සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කළ හැකිය.

එවැනි සියලුම ඉදිරිපත් කිරීම් 2021.11.29 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට මෙම ජනාධිපති කොමිෂන් සභාවේ ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන්, කුරියර් මගින් හෝ විද්‍යුත් තැපෑලෙන් එවිය යුතුය.

එවැනි සියලු ඉදිරිපත් කිරීම්වලට අදාළ තැනැත්තන් තම නම, ලිපිනය. දුරකථන අංකය හා විද්‍යුත් තැපැල පැහැදිළිව සඳහන් කළ යුතුය.

කොමිෂන් සභාවේ අණ පරිදි

**ලේකම්**
**විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව**
**පළමු මහළ, බ්ලොක් 05, බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07**
**දුරකථන අංකය - 0112669135.**
**ෆැක්ස් අංකය - 0112677673**
**විද්‍යුත් තැපෑල spcipv@gmail.com**


## දඩගමුව විහාරයේ කඨින පින්කම

**(වාරණ ආනන්ද ඉ. ජයකොඩි)**

**ඓතිහාසික දඩගමුව රජමහා විහාරස්ථානයේ වාර්ෂික කඨින චීවර පූජා පින්කම මෙම 17 හා 18 දෙදින පුරාම එම විහාරස්ථානයේදී පැවැත්වේ.**

විහාරාධිපති මැටිකොටුමුල්ලේ ප්‍රේමරතන හිමියන්ගේ අනුශාසනා පරිදි 17 වැනිදා රාත්‍රී කඨින චීවරය වේයන්ගොඩ පාරමුල්ලේ ව්‍යාපාරික ප්‍රියන්ත වික්‍රමාරච්චි මහතාගේ නිවෙසේ සිට පෙරහරින් විහාරස්ථානය වෙත වැඩම කොට පසු දින 18 වැනිදා පාන්දර සංඝගත දක්ෂිණාවක් පවත්වා කඨින චීවරය පූජා කිරීම සිදු කෙරේ.

කඨිනානිසංස ධර්ම දේශනාව මෙදින පස්වරුවේ පැවැත්වේ.

## විශ්‍රාමික නි.විදුහල්පති හිමිනමක් කොරෝනාවෙන් අපවත් වෙති

**(කෑගල්ල අධිකරණ චමින්ද වැවතැන්න)**

**කෑගල්ල හෙට්ටිමුල්ල මිනුවන්ගමුව විද්‍යාවාස මහා පිරිවෙන් විහාරස්ථානයේ වැඩ සිටි විශ්‍රාමික නියෝජ්‍ය විදුහල්පති හිමි නමක් කොවිඩ් ආසාදනය වීමෙන් පෙරේද (13 වැනිදා) අපවත් වී ඇති බවත්, එම පිරිවෙනෙහි අධ්‍යාපනය ලබන නේවාසික සාමණේර ශිෂ්‍ය භික්ෂුන්වහන්සේලා 13 නමකටත් කොවිඩ් ආසාදනය වී ඇතැයි කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය පවසයි.**

මෙලෙස කොවිඩ් ආසාදනය වීමෙන් අපවත් වී ඇත්තේ, කෑගල්ල හෙට්ටිමුල්ල මිනුවන්ගමුව විද්‍යාවාස මහ පිරිවෙන් විහාරස්ථානයේ වැඩ සිටි අම්පාර උහන තිස්සපුර මහා විද්‍යාලයේ ඉංග්‍රීසි ගුරුවරයකු ලෙස කලක් සේවය කර, පසුව නියෝජ්‍ය විදුහල්පතිවරයකු ලෙස කටයුතු සිදු කර ඇති ඇකිරියගල චන්ද්‍රවිමල නමැති 67 හැවිරිදි හිමි නමක් බව මහජන සෞඛ්‍ය පරීක්ෂක බණ්ඩාර අත්තනායක මහතා පැවැසීය.

අපවත් වී වදාළ චන්ද්‍රවිමල ස්වාමීන්වහන්සේ ඉකුත් 7 වැනිදා කෑගල්ල මහ රෝහලට ඇතුළත් කර අංක 06 වාට්ටුවේ නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටියදී පෙරේද (13 වැනිදා) සවස අපවත් වූහ.

# රාජ්‍ය සේවය රටට බරක් කරගනු එපා

මහජනතාවට බරක් නොවන අයවැයක් සකස් කිරීමට පරෙස්සම් වූ බව තම මංගල අයවැය ප්‍රකාශයට පත්කරමින් මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා පාර්ලිමේන්තුවේදී සඳහන් කළේය. එසේ වුවද අයවැය ඉදිරිපත් කිරීමෙන් පසුව මුදල් අමාත්‍යාංශය මගින් කැඳවා තිබූ විශේෂ මාධ්‍ය සාකච්ඡාවේදී රාජ්‍ය සේවය පිළිබඳ මුදල් අමාත්‍යවරයා කළ සඳහන රටේම අවධානය දිනාගෙන තිබේ. ඔහු එහිදී ප්‍රකාශ කළේ රාජ්‍ය සේවයේ බර රජයට තවදුරටත් දරාගත නොහැකි මට්ටමකට පත්ව තිබෙන බවය. තවත් වසරක් සඳහා රාජ්‍ය සේවයට මහජන අරමුදල් වෙන් කිරීමට හැකි තත්ත්වයක රජය නොසිටින බව ද රජයේ සේවකයන්ට තවදුරටත් "ලොසින්ජර" ලබාදීම අවශ්‍ය නැති බව ද ඔහු වැඩිදුරටත් කියා තිබිණි.

මේ රටේ රාජ්‍ය සේවය දිගින් දිගටම අසීමිත ලෙස ප්‍රසාරණය වෙමින් පවතින බව බැලූ බැල්මටම පෙනෙන සාධකයකි. තත්ත්වය එසේ වනවිට රාජ්‍ය සේවයේ අධික වැටුප් බර ඉතා දුර්වල ආර්ථිකයක් පවතින මේ රටට තවදුරටත් දරාගත නොහැකිවීම බලාපොරොත්තු විය යුත්තකි. රාජ්‍ය සේවයට එකතුවන සේවක සංඛ්‍යාව පමණක් නොව රාජ්‍ය සේවයේ වැටුප් තල ද වාර්ෂිකව ඉහළ යමින් පවතී. ඒ අතරවාරයේ වෘත්තීය සමිති අරගල හරහා ද වැටුප් වැඩි කෙරේ. වැටුප් විෂමතා සකස් කිරීම් වශයෙන් ද සිදුවන්නේ වැටුප් තල ඉහළ යාමය. රාජ්‍ය බැංකු සහ රාජ්‍ය ආයතන සේවකයෝ සාමූහික ගිවිසුම් හරහා වසර තුනකට වරක් වැටුප් වැඩිකර ගනිති. මේ සියලු වැඩිවීම් සිදුවන්නේ රජයේ ආදායම් තත්ත්වය දිගින් දිගටම පහළ යන තත්ත්වයකදී වීම ලොකුම ඛේදවාචකයයි.

රාජ්‍ය සේවයට ඇතුළු වීමට තරුණ තරුණියන් (රැකියා විරහිත උපාධිධාරීන් ද ඇතුළුව) දරන උත්සාහයේ ලොකුම "ලොසින්ජරය" විශ්‍රාම වැටුප බව රහසක් නොවේ. විශ්‍රාම වැටුපට ලොල් වී අතේ තිබෙන වටිනා පෞද්ගලික අංශ රැකියා පවා අතහැර රාජ්‍ය සේවයට එකතුවීමට වෙර දරන තරුණ පිරිස් ඕනෑ තරම් සිටිති. රාජ්‍ය සේවයේ රැකියා ලබාදෙන බවට සෑම ප්‍රධාන මැතිවරණයකදීම දේශපාලන නායකයන් විසින් තරුණ තරුණියන්ට ලබාදෙන පොරොන්දුව බලය ලබාගැනීමේ ප්‍රධාන සාධකයක් බවට පත්ව ඇත. මේ වාතාවරණය යටතේ ඕනෑම මුදල් අමාත්‍යවරයකුට බජට් එක බැලන්ස් කර ගැනීම උභතෝකෝටිකයක් වීම වළක්වාගත නොහැක. රාජ්‍ය සේවය පවත්වාගෙන යාමට දැරිය යුතු වියදම බජට් එකේ සාරය උරාබොන විට සෙසු අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සකල ලෝකයටම ණය වීමට සිදුවීම අරුමයක් නොවේ. බැසිල් රාජපක්ෂ මුදල් අමාත්‍යවරයා රාජ්‍ය සේවය පිළිබඳව සිදුකළ ප්‍රකාශය රජයේ සේවයේ බොහෝ දෙනකුට දිරවා ගැනීම අසීරු විය හැකි වුවද ඔහු මේ ප්‍රකාශ කරන්නේ යථාර්ථය බව සියලුදෙනා විසින්ම අවබෝධ කරගත යුතුය. රාජ්‍ය සේවය තවදුරටත් රටේ ආර්ථිකයේ "බරවා කකුල" බවට පත්විය යුතු නැත. එහෙත් දේශපාලන නායකයන් තමන්ට අහිමි විය හැකි ඡන්දය හේතුවෙන් "බරවා කකුල" අතහරින්නට කැමැති නැත.

රාජ්‍ය සේවය රටට වැදගත් නොවන බවක් මෙයින් අර්ථ නොගැන්වෙයි. එහෙත් හුදෙක් දේශපාලන වාසි තකා රජයේ රැකියා ලබාදීමේ පිළිවෙතින් බැහැරවීමට දේශපාලනඥයන් දැන්වත් සිතට ගත යුතු බව පෙන්වා දීමට කැමැත්තෙමු. රැකියා ලබාදීමට මැති ඇමැතීන්ට ඉඩ ලබා දී රාජ්‍ය සේවය රටට බරක් යැයි පැවසීම නන්දෙඩවීමක් පමණි. පවතින යථාර්ථය හඳුනාගෙන අවශ්‍ය පියවර ගැනීම රජයක වගකීමය. ඇතැම් රාජ්‍ය ආයතනවල කරන්න රාජකාරියක් තබා හිඳ ගැනීමට පුටුවක් හෝ නොමැති පිරිස් ද සිටින බව වරින්වර වාර්තා වුවද රජයේ සේවයේ රැකියා ලබාදීම තාවකාලිකව හෝ නැවැත්වීමට කිසිදු රජයක් පියවර ගත්තේ නැත.

එපමණක් නොව රාජ්‍ය සංස්ථා සහ විවිධ ආයතන ලබන අධික පාඩුව ද රටේ අයවැයට ඇති කරන්නේ විශාල බරකි. මේ වනවිට එවැනි ඇතැම් රාජ්‍ය ආයතන වසා දැමීම හැර වෙනත් විකල්පයක් නොමැති තරමට තත්ත්වය බරපතළ වී තිබේ. රටේ ආර්ථිකයේ රීරිමාංස උරා බොමින් පවත්වාගෙන යන මේ ආයතනවල සේවකයන් වැටුප් ලබන්නේ මේ රටේ ජනතාවගේ බදු මුදලිනි. ශ්‍රී ලංකන් ගුවන් සමාගම, තෙල් සංස්ථාව, පොදු ගමනාගමන සේවා, ලංවිම ඇතුළු බොහෝමයක් රාජ්‍ය ආයතනවල සැබෑ තත්ත්වය එයයි. මෙවැනි ආයතන සම්බන්ධයෙන් ඉදිරියේදී රජය අනුගමනය කරන ප්‍රතිපත්තිය කුමක්දැයි අයවැය ප්‍රකාශයේ පැහැදිලිව සඳහන් නොවීම අඩුපාඩුවකි. රාජ්‍ය සේවයට ලබාදෙන පෙට්‍රල් ප්‍රමාණය ලීටර් කිහිපයකින් කප්පාදු කිරීම එයට පිළිතුරක් නොවේ.

රටේ ආර්ථික තත්ත්වය යළි පණගැන්වීමට පැලැස්තර විසඳුම් ප්‍රමාණවත් නැත. ඒ සඳහා ප්‍රබල ප්‍රතිපත්තිමය තීන්දු ගත යුතු තත්ත්වයකට රට තල්ලු වී තිබේ. එහෙත් එවැනි බරපතළ වෙනස්කම් සිදුකිරීමට අවශ්‍ය දේශපාලන ධෛර්ය වත්මන් රජය තුළ තිබේද යන්න ගැටලුවකි. අඩුම තරමින් තාවකාලික පියවරක් වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකතුවීමට හෝ රජය දක්වන අකැමැත්තෙන් එය පැහැදිලි වෙයි. ඔවුන්ගේ මූලිකම කොන්දේසියක් වනු ඇත්තේ රාජ්‍ය සේවය කප්පාදු කිරීම බැවිනි. රටේ පවතින බරපතළ ආර්ථික ගැටලුවලට විසඳුම් ඇත්තේ මන්නාරම් ද්‍රෝණියේ ගෑස් නිධි සහ පෝර්ට් සිටියට එන ඩොලර් බිලියන 35 වැනි සිහින ලෝකවල නොව මහපොළොවේ යථාර්ථය මත බව හඳුනාගන්නා තුරු අපේ රටට ගැලවීමක් නම් නැත.

ලංකාදීප

2021 නොවැම්බර් මස 15 වැනිදා සඳුදා

අන්තර්ජාලයේ ප්‍රථම සිංහල පුවත්පත

වෙබ් අඩවි--: වෙබ්.ලංකාදීප.ලංකා- www.lankadeepa.lk

කර්තෘ මණ්ඩලය : 2448321, 2423919, 5383237 ෆැක්ස් : 2438039, 2479240, 5383240 බෙදාහැරීම් : 2479625 ෆැක්ස් : 2479650

දැන්වීම් :2479540, 5383383, 5330330, ෆැක්ස් : 2314864, 2479595

## 2022 අය වැය විමසුම

# අභියෝග ජයගත් අයවැයක්

**කොරෝනා වසංගතය හමුවේ රට මුහුණදී සිටින ආර්ථික අර්බුදයට විසඳුම් දීමටත් මහජනතාවගේ ආර්ථික පීඩනය අවම කිරීමටත් කටයුතු කරන අතරම රට දියුණු නිෂ්පාදන ආර්ථික ක්‍රමයකට පරිවර්තනය කිරීම 2022 අයවැය ලේඛනයේ මූලික අරමුණ වී ඇත.**



කොරෝනා ව්‍යසනය පැතිරීමට පෙර යුගයේ රජයේ වාර්ෂික අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී සැලකිල්ලට ගතයුතු වූයේ සාර්ව ආර්ථික කළමණාකරණයට අදළ කරුණු සහ රජයේ ආදායම් - වියදම් තුලනය කිරීමට අදළ කරුණු පමණකි. එහෙත් වසංගතය ඒ සියල්ල වෙනස් කර ඇත. මහා බලවත් රටවල්, මහා ධනවත් රටවල් සහ ඉහළම තාක්ෂණික දියුණුවක් ඇති රටවල් සිට ඉතාම නොදියුණු සහ දුප්පත් රටවල් දක්වා සියලුම රටවල් කොරෝනා ඉදිරියේ අසරණ වී ඇත. ආර්ථිකය කඩාවැටී සැපයුම් මාර්ග අවහිර වී මිනිස් සම්බන්ධතා දුරස් වී මරණ බිය, රෝග බිය, අවිනිශ්චිතතාව සහ අනියත බව රජ කරන සමාජයක් බිහි වී ඇත. එවැනි තත්ත්වයක් තුළ අයවැය යෝජනා සාම්ප්‍රදායික කාර්ය භාරයට අමතරව මහජනතාවගේ ජීවන අපේක්ෂා දැල් විය හැකි අපේක්ෂා භංගත්වයට පත්ව ඇත පිරිස්වලට ජීවයක් ලබාදිය හැකි පරිසරයක් නිර්මාණය කිරීමේ වගකීම ද ඉටු කළ යුතුව ඇත. ඒ අතරම කොරෝනා වසංගතය හමුවේ මුහුණදී සිටින දරුණු ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා අනුගමනය කළ යුතු උපාය මාර්ග මෙන්ම වෙනස් වූ ආර්ථික වට පිටාව හමුවේ රට සංවර්ධනය කරා ගමන් කළ යුතු දිශානතිය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක්ද ඉදිරිපත් කළ යුතුව ඇත.

මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා විසින් 2022 වර්ෂයට අදළව ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනය පිළිබඳ විමසා බැලිය යුත්තේ එම කරුණුවලට අදළව රජයේ උපාය මාර්ග සහ ආර්ථික ප්‍රතිපත්ති කෙසේ සකස් වී ඇත්තේද යන්න පදනම් කරගෙනය. කොරෝනා අර්බුදය හමුවේ ඇතිව තිබෙන ආර්ථික ගැටලුවලට පිළියම් යෙදීමේත් 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශනයේ එළිදක්වා ඇති ආර්ථික වෙනස්කම්වලට අදළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදීත් ශ්‍රී ලංකාව දැනට මුහුණදී සිටින තත්ත්වය පිළිබඳ ඉතා පැහැදිලි විනිශ්චයක් අයවැය ලේඛනය ඉදිරිපත් කරමින් මුදල් ඇමතිවරයා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය. අභියෝගයේ ස්වරූපය, එයට මුහුණ දී මේදී රටක් ලෙස හිමිව තිබෙන ශක්තිය සහ දුර්වලතා පැහැදිලිව විස්තර කළ ඔහු නිෂ්පාදන ආර්ථිකයක් ඇති රටවල් අභියෝග හමුවේ ඒවාට ඔරොත්තු දීමේ හැකියාව ලබාගෙන ඇති ආකාරය පෙන්වා දුන්නේය.

ශ්‍රී ලංකාව කාලාන්තරයක් තිස්සේ පවත්වාගෙන යනු ලබන්නේ වාණිජ සේවා ආර්ථිකයකි. භාණ්ඩ අපනයනය කර ආනයන මගින් තම අවශ්‍යතා වැඩි ප්‍රමාණයක් සම්පූර්ණ කරගන්නා සහ ආර්ථිකය තුළ ජාතික ආදයමට සේවා අංශයෙන් වැඩිම දයකත්වයක් ලබාදෙන ආර්ථික ක්‍රමයක් පවත්වා ගෙන යාම තුළ පවතින අස්ථාවරභාවය ඇමැතිවරයා පැහැදිලි කළේය.

එබැවින් පවතින සේවා ආර්ථික ක්‍රමය වෙනුවට නිෂ්පාදන භාණ්ඩ වැඩි වශයෙන් නිෂ්පාදනය කරන නිෂ්පාදන ආර්ථිකයකට පිවිසීමේ අවශ්‍යතාව අවධාරණය කළ අතර එම පරිවර්තනය සඳහා මෙම අයවැය ලේඛනය මගින් ඉඩසලසා දී ඇති බව පැහැදිලි කළේය. මුදල් ඇමතිවරයා විසින් අයවැය ලේඛනය මගින් ප්‍රකාශයට පත් කරන ලද ආර්ථික උපාය මාර්ග පිළිබඳ මෙම වෙනස තුළින් රටේ ආර්ථික ගමන් මඟ පිළිබඳව පැහැදිලි වෙනසකට මුල පුරා ඇති බව සඳහන් කළ යුතුය. එදිනෙදා පරිභෝජනයට අවශ්‍ය භාණ්ඩවල සිට තවත් බොහෝ දේවල් ආනයනය කර ඒවා මගින් තම මූලික අවශ්‍යතා පිරිමසා ගන්නා රටක් බවට ශ්‍රී ලංකාව පත්ව ඇත. අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල මිල ඉහළ යෑම ආදී ගැටලුවලට මුහුණදීමට සිදුව ඇත. එවැනි ගැටලු හේතුවෙන් කොරෝනා වසංගතය මගින් පැහැදිලි කර දුන්නේ එවැනි සේවා ආර්ථිකයක් පැවතීම රටකට කොතරම් අස්ථාවරත්වයක් සහ අනාරක්ෂිතභාවයක් ගෙන දෙන්නේද යන්නයි.

## ආර්ථික අර්බුදයට විසඳුම් රැසක්

එබැවින් පවතින වාණිජ සේවා ආර්ථිකය වෙනුවට දියුණු නිෂ්පාදන ආර්ථිකයක් වෙත පියනැගීම සඳහා අවශ්‍ය උපාය මාර්ගික ප්‍රවේශයක් හඳුන්වාදීමත් ඒ සඳහා අවශ්‍ය යෝජනා අයවැය ලේඛනය මගින් ඉදිරිපත් කිරීමත් හැඳින් විය හැක්කේ නිදහසින් පසු වසර73ක අපේ ආර්ථික ප්‍රතිපත්තියේ දැවැන්ත පරිවර්තනයක් සඳහා මුලපිරීමක් ලෙසිනි.

විනිමය හිඟය, ඒ නිසා ඇතිව තිබෙන භාණ්ඩ හිඟය, ලෝක නිෂ්පාදන සහ සැපයුම් ජාලවල ඇතිව තිබෙන අර්බුදය හේතුවෙන් අප ආනයනය කරන භාණ්ඩවල මිල ගණන් වේගයෙන් ඉහළයාම වැනි ප්‍රශ්නවලට ක්ෂණික විසඳුමක් නැත. සංචාරක අංශයේ බිඳවැටීම, විදේශ ශ්‍රමිකයන් විසින් එවනු ලබන ප්‍රේෂණ පහළයාම, ඍජු ආයෝජන ප්‍රමාණය පහළ යාම වැනි ප්‍රශ්නවලට විසඳුම් ලබාදිය හැක්කේ ඉතා ඉක්මනින් ජනජීවිතය යථාතත්ත්වයට පත්කර ගැනීමෙන් සහ ආර්ථිකය තුළ නිෂ්පාදන සහ සේවා කටයුතු යථාතත්ත්වයට පත්කර ගැනීම තුළින් පමණි.

ආර්ථිකයේ බොහෝ අංශවලට තවමත් පෙර පැවැති තත්ත්වයට පැමිණීමට නොහැකි වී ඇත්තේ කොරෝනා අර්බුදය හමුවේ එම අංශවලට එල්ල වූ පීඩනයෙන් ගොඩ ඒමට ඒවාට නොහැකි වී ඇති බැවිනි.

ආර්ථිකය යථාතත්ත්වයට ගෙන ඒම සඳහා යෝජනා ඉදිරිපත් කරමින් මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ මහතා කඩල, බුලත්විට, වඬේ, තැඹිලි අලෙවි කරන අයගේ පටන් සුළු සහ මධ්‍යම පරිමාණ අංශයේ ව්‍යවසායකයන් දක්වා පිරිස් කොරෝනා හමුවේ අර්බුදයට ලක්වී ඇති ආකාරය විස්තර කළේය. එබැවින් එවැනි අය, පාසල් වෑන් රථ හිමිකරුවන් මෙන්ම, පුද්ගලික බස් රථ සේවාව, ත්‍රීරෝද රථ සේවාව තුළ ද කලා නිර්මාණ අංශවල සහ උත්සව සංවිධාන කටයුතුවල නියැළෙන අය වැනි සියලු දෙනාට සහන සැලසීම සඳහා ඒ ඒ අංශවලට වෙන වෙනම අරමුදල් වෙන්කිරීමට අයවැය යෝජනා මගින් ඉඩ සලසා තිබේ. ඒ හේතුවෙන් එම අංශ යළි නගා සිටුවීම සඳහා ඉඩ ලැබෙනු ඇත.

මන්ත්‍රීවරුන්ගේ ඉන්ධන දීමනාව අඩුකිරීම, රජයේ නව කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම නතර කිරීම, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතනවල අතිරේක ප්‍රතිපාදන සඳහා ඉඩනොතැබීම, මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිය සඳහා වසර10ක් අවශ්‍යවීම, ආදිය රාජ්‍ය අංශයේ මූල්‍ය විනයක් සහ පාලනයක් ඇති කිරීම සඳහා හඳුන්වා දුන් පියවර ලෙස හැඳින් විය හැකිය.

ඒ ආකාරයට ඇතැම් වියදම් සීමාකරන අතර ජනතාවගේ ජීවන මට්ටම සුරක්ෂිත කරලීම සඳහාත් ඔවුන්ට සහන ලබාදීම සඳහාත් අලුත් යෝජනා හඳුන්වා දී ඇත. ගැබිනි මව්වරුන් සඳහා වූ සහන මල්ල නැවත හඳුන්වා දීම සහ එය මාස විසිහතරක් දක්වා දිගුකිරීම, දිළිඳු පිරිස් සඳහා සහන මල්ලක් හඳුන්වාදීම වැනි යෝජනා රැසක් අයවැය ලේඛනයේ අඩංගුව පවතී. ඇතැම් වියදම් සීමාකරන අතරම ආර්ථික අර්බුදයක් පවතිද්දී වුවද සමාජ සුබසාධනය ඉහළ නැංවීම සඳහා ඒ ආකාරයෙන් යෝජනා ඉදිරිපත් කිරීම තුළින් පැහැදිලි වන්නේ අතිශය දුෂ්කර තත්ත්වයකට මුහුණ දී සිටියදී වුවද සහන ලබාදිය යුතු පිරිස් පිළිබඳව අවධානය යොමු කර ඇති බවයි.

ආර්ථිකය මුහුණ දී සිටින සහ මහජනතාව මුහුණදී සිටින දුෂ්කරතාවලට සහ පීඩනවලට ඔරොත්තු දීම සඳහා එවැනි යෝජනා ඉදිරිපත් කිරීම මගින් කොරෝනා වසංගතය හේතුවෙන් බොහෝ දෙනකු මුහුණදී සිටින ආර්ථික ගැටලුවලට සැලකිය යුතු විසඳුමක් ලබාදී ඇති බව පැහැදිලිය. ඒ අතරම එවැනි තත්ත්වයක් යටතේ අපේක්ෂාභංගත්වයට මුහුණ දී සිටි අවිනිශ්චිතතාවකට සහ දැඩි පීඩනයකට ගොදුරු වී සිටි බොහෝ පිරිසකට තම ජීවිත යළි ගොඩනංවා ගැනීම සඳහා අවම අවස්ථාව සැලසෙනු ඇත.

කෙටි කාලීන උපාය මාර්ග ලෙස එවැනි පියවර අනුගමනය කර ඇති අතර මැදිකාලීන සහ දිගුකාලීන උපාය මාර්ග වැඩි වශයෙන්ම යොමු වී ඇත්තේ දියුණු නිෂ්පාදන ආර්ථිකයක් බවට පරිවර්තනයවීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායයන් හඳුන්වා දීමට බව පෙනී යයි. කෘෂිකාර්මික අංශය, කාර්මික අංශය, ධීවර අංශය, වැවිලි අංශය, සුළු අපනයන බෝග අංශය, සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදන අංශ ගැන පමණක් නොව පාරම්පරික නිෂ්පාදන අංශ ද ඇතුළත් වන සේ එම උපාය මාර්ග අයවැය ලේඛනය මගින් එළිදක්වා ඇත.

කෘෂිකාර්මික, කාර්මික සහ සේවා අංශවල සංවර්ධනය සඳහා මූලික වශයෙන්ම වැදගත් වන්නේ තාක්ෂණික සහ උසස් නිෂ්පාදන ක්‍රම යොදා ගැනීම බව යළි යළිත් අවධාරණය කර ඇති අතර එම අංශවල සංවර්ධනය සඳහාත් නව තාක්ෂණය යොදා ගැනීම සඳහාත් නවෝත්පාදන සඳහාත් අරමුදල් වෙන් කර ඇත.

රාජ්‍ය අංශයේ වියදම් වැඩිවීම සඳහා මෙන්ම ආර්ථික සංවර්ධනය වෙනුවෙන් යෙද විය හැකි මූල්‍ය සම්පත් නාස්තිවීම සඳහාත් ඇතැම් රාජ්‍ය ව්‍යවසාය හේතු වී ඇත. මෙවැනි ආයතන විධිමත් අයුරින් කළමණාකරණය කිරීම සඳහා නිශ්චිත වැඩපිළිවෙළක් අයවැය ලේඛනය මගින් ඉදිරිපත් කර ඇති අතර ඉදිරියේදී රටට මෙන්ම ආර්ථිකයටද බරක් නොවන අයුරින් ඒවා හැඩගස්වා ගැනීම සඳහා එමගින් අවස්ථාව සැලසෙනු ඇත.

සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය සකස් කිරීම සඳහා රටපුරා ග්‍රාමීය ජනතාවගේ අදහස් ලබාගැනීම සඳහා ජනාධිපතිවරණයට පෙර ගම සමඟ පිළිසඳරක් වැඩසටහන් යටතේ ග්‍රාමීය ජනහමු පවත්වන ලදී. මෙවර අයවැය සකස් කිරීම සඳහා ද නැවත වරක් ඒ ආකාරයටම සියලුම ග්‍රාම සේවා කොට්ඨාසවල මහජනතාව හමු වී සංවාද පවත්වන ලදී. ඒ අනුව සකස් කරන ලද වැඩපිළිවෙළ මෙවර අයවැය ලේඛනයට ඇතුළත් කර තිබේ. රටපුරා ග්‍රාම සේවා කොට්ඨාශ14,000කට වැඩි ප්‍රමාණයක් ඇති අතර ඒ සෑම කොට්ඨාසයකටම රුපියල් තිස් ලක්ෂයක් බැගින් වෙන්කර ඇත. ප්‍රාදේශීය සභා ඡන්ද කොට්ඨාස 4417සඳහා එකකට රුපියල් ලක්ෂ හතලිහ බැගින් වෙන්කර ඇත. සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මේ දක්වා ලැබුණු විමධ්‍යගත අරමුදලට අමතරව තවත් ලක්ෂ පනහක් බැගින් ලබා දී ඇත. සෑම ගමකටම නිවාස වැඩසටහනක් ද කාන්තා ව්‍යවසායක වැඩසටහනක් ද වෙනුවෙන් මුදල් වෙන් කර තිබේ. ග්‍රාමීය සංවර්ධනය සඳහා වෙන්කර ඇති මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 85,000ක් වේ. මුදල් ඇමැතිවරයා විසින්ම සඳහන් කර ඇති පරිදි ඉතිහාසය තුළ ග්‍රාමීය සංවර්ධනය සඳහා මෙපමණ මුදල් ප්‍රමාණයක් වෙන්කර ඇති ප්‍රථම අවස්ථාව මෙයයි. ඒ අතරම පුනර්ජනනීය බලශක්තිය දියුණු කිරීම, ජල සැපයුම් සංවර්ධනය සහ ජාතික පාසල් 1000ක් වැනි ව්‍යාපෘති සඳහා ද මුදල් වෙන්කර තිබේ. ග්‍රාමීය ප්‍රදේශ වැඩි දියුණු කර ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම මගින් ග්‍රාමීය අංශයේ විශාල වෙනසකට ඉඩ සලසා ඇති ආකාරය දැකගත හැකිය.

## ග්‍රාමීය සංවර්ධනයට වැඩි බරක්

රට දැවැන්ත ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටින අවස්ථාවක ආර්ථික සංවර්ධනය සඳහාත් මහජනතාවගේ සුබ සාධනය සඳහාත් මේ ආකාරයේ දැක්මක් සහිත අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීම තුළින් අර්බුදය ජයගෙන රට සංවර්ධනය කරා යොමු කිරීමේ රජයේ අභිලාෂය සහ එයට ඇති කැපවීම පැහැදිලි වේ. කෙසේ වුවද විශේෂත්වය වන්නේ පොදු මහජනතාවට බරක් නොවන ආකාරයෙන් ඒ සඳහා මුදල් සොයා ගැනීමට කටයුතු කර තිබීමයි. රුපියල් මිලියන 2000ට වඩා ලාභ ලබන සමාගම්වලින් අය කරන බදු ප්‍රමාණය ඉහළ දමා ඇත. බැංකු සහ මූල්‍ය ආයතනවලට අදළ වැට් බදු ප්‍රමාණය සියයට 3 කින් ඉහළ දමා ඇති නමුත් එය පාරිභෝගිකයාගෙන් අයකරගැනීමට නොහැකි බව දක්වා ඇත. දුම්වැටි සහ මත්පැන්වල බදු ප්‍රමාණය ඉහළ දමා ඇත. රට මුහුණ දී සිටින ආර්ථික අර්බුදය හමුවේ බොහෝ දෙනෙකු සිතුවේ රජයේ බදු ප්‍රමාණය ඉහළ දමා දැඩි බදු ක්‍රමයක් හඳුන්වා දෙනු ඇති බවය. එහෙත් පොදු මහජනතාවට බලනොපාන බදු සංශෝධන ඔස්සේ රජයේ ආදයම වැඩි කර ගැනීමට කටයුතු කර තිබීම විශේෂත්වයක් ලෙස සැලකිය හැකිය.

රජයේ සේවකයන්ට සහ වැඩකරන ජනතාවට මෙම අයවැයෙන් කිසිදු සහනයක් සලසා නැති බවට ඇතැම් අය චෝදනා නගන බව පෙනේ. බොහෝ රටවල අතිවිශාල සේවකයන් පිරිසකට කොරෝනා වසංගතය හේතුවෙන් රැකියා අහිමි වී ඇත. එවැනි තත්ත්වයකට ශ්‍රී ලංකාවේ වැඩ කරන ජනතාවට මුහුණ දීමට සිදු වී නැත. පසුගියද රජය පුද්ගලික අංශයේ සේවකයන්ගේ විශ්‍රාම වයස අවුරුදු 60 දක්වා ඉහළ නැංවූයේය. මෙම අයවැය ලේඛනයෙන් රජයේ සේවකයන්ගේ ද විශ්‍රාම වයස අවුරුදු 65 දක්වා ඉහළ නංවා ඇත. ගුරු විදුහල්පති වැටුප් වැඩි කිරීම සඳහා රුපියල් මිලියන 31000ක් වැඩිපුර වෙන් කර තිබේ.


2021 වසරේ දී අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 11.1ක මට්ටමකට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එය සාමාන්‍ය තත්ත්වයක දී හොඳ මට්ටමක් ලෙස සැලකිය නොහැක. එසේ වුවද කොරෝනා වසංගතය හමුවේ සෑම රටක්ම පාහේ අයවැය හිඟය සාමාන්‍ය කාල පරිච්ඡේදයක දී පැවති තත්ත්වයට වඩා ඉහළ ගොස් ඇත. 2022 අයවැය මගින් අයවැය හිඟය සියයට 8.8ක් දක්වා අඩු කිරීමට සැලසුම් කර ඇත.

කොරෝනා වසංගතය හමුවේ රට මුහුණදී සිටින ආර්ථික අර්බුදයට විසඳුම් දීමටත් මහජනතාවගේ ආර්ථික පීඩනය අවම කිරීමටත් කටයුතු කරන අතරම රට දියුණු නිෂ්පාදන ආර්ථික ක්‍රමයකට පරිවර්තනය කිරීම 2022 අයවැය ලේඛනයේ මූලික අරමුණ වී ඇත.



මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ මහතා සියලු අභියෝග ආක්‍රමණය කළ හැකි ශක්තියක් රජයටත් මහජනතාවටත් ඇති බව ප්‍රකාශ කළේය. අයවැය ලේඛනයේ යෝජනා නිසි පරිදි ක්‍රියාත්මක කිරීම මගින් අභියෝග අතික්‍රමණය කිරීමට රටට හැකියාව ලැබෙනු ඇත.

මහාචාර්ය **සුනන්ද මද්දුම බණ්ඩාර** විසිනි




**පෝය ලබන ගෙවෙන වේලාවන්**

| දිනය | පෝය | පෝය ලබන වේලාව | පෝය ගෙවෙන වේලාව |
|---|---|---|---|
| නොවැ:18 | පසළොස්වක | ප.ව.12.00 | 19 දා පෙ.ව.14.27 |
| නොවැ:27 | අව අටවක | පෙ.ව.5.43 | 28 දා පෙ.ව.06.00 |
| දෙසැ:03 | අමාවක | ප.ව.16.55 | 04 දා ප.ව.13.12 |
| දෙසැ:10 | පුර අටවක | ප.ව.19.09 | 11 දා ප.ව.19.13 |

හදිසි දුරකතන ඇමැතුම් අංක | පොලිස් මූලස්ථානය 2421111 | පොලිස් හදිසි ඇමැතුම් 2433333 | අල්ලස් කො.දෙ. 1954 | යුද හමුදා මූලස්ථානය 2432683 | බෝම්බ නිශ්ක්‍රීය අංශය 2434251 | ගුවන් හමුදා මූලස්ථානය 2441044

## කටුවන ලංකාදීප අලෙවි නියෝජිතගේ නැන්දණිය කලුරිය කරයි



කටුවන, ලංකාදීප අලෙවි නියෝජිත, චන්ද්‍රා ස්ටෝර්ස් අධිපති දිලාන් විජේසිංහ මහතාගේ නැන්දණිය වූ කටුවන එ.ජා.ප. ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි, සාමවිනිසුරු චන්ද්‍රා විජේසිංහ මහත්මිය අභාවප්‍රාප්ත වූවාය.

මිය යන විට ඇය 69 වන වියෙහි පසු වූවාය.

අවසන් කටයුතු ඊයේ (14 වැනිදා) සිදු කෙරිණි.

# ලක්ෂ 70 ක 'අයිස්' එක්ක තලෙයිමන්නාරමේදී දෙදෙනෙක් අත්අඩංගුවට

(ඉන්දිකා රාමනායක)

රුපියල් ලක්ෂ 70 කට අධික වටිනාකමින් යුත් අයිස් මත්ද්‍රව්‍ය තොගයක් ත්‍රිරෝද රථයකින් ප්‍රවාහනය කරමින් සිටි බව කියන සැකකරුවෝ දෙදෙනෙකු තලෙයිමන්නාරම ස්වාමිතෝට්ටුම් ප්‍රදේශයේදී පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය විසින් අත්අඩංගුවට ගනු ලැබූහ.

ඔවුන් සතුව අයිස් මත්ද්‍රව්‍ය කිලෝ 2 කට අධික ප්‍රමාණයක් තිබී ඇතැයි පොලිසිය කියයි.

සැකකරුවන් පිරිසක් අයිස් මත්ද්‍රව්‍ය තොගයක් ප්‍රවාහන කරන බවට පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ නිලධාරීන්ට ලැබුණු තොරතුරක් මත පෙරේද (13) පස්වරුවේ ඔවුන් අත්අඩංගුවට ගත් බව පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය පවසයි.

අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ ත්‍රිරෝද රථයේ පිටුපස ගමන් ගත් පුද්ගලයා මෙම අයිස් මත්ද්‍රව්‍ය තොගය සිය උකුල මත තබාගෙන ගමන් ගනිමින් සිට ඇති බවද පොලිසිය සඳහන් කරයි.

අත්අඩංගුවට ගත් සැකකරුවන් දෙදෙනා මන්නාරම නානාට්ටාන් ප්‍රදේශයේ පදිංචිකරුවන් බවද කියති.

අත්අඩංගුවට ගත් අයිස් මත්ද්‍රව්‍ය හා සැකකරුවන් වැඩිදුර පරීක්ෂණ සඳහා තලේමන්නාරම පොලිසියට බාරදී ඇත.

# රාජ්‍ය කඨින මහෝත්සවය ජනපති මූලිකව කුරුණෑගලදී පෙර සිරිතට සිදුකෙරේ

(සුජිත් හේවාජුලිගේ)



ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා කඨින චීවරය මහා සංඝරත්නයට පූජා කළ අවස්ථාව.

රාජ්‍ය කඨින මහෝත්සවය සහ පඬුපෙවීමේ මහා මංගල්‍යය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් කුරුණෑගල කොළඹගම ශ්‍රී මියුගුණාරාම රජමහා විහාරස්ථානයේදී ඊයේ (14) පෙරවරුවේ පැවැත්විණි.

දෙවැනි පරාක්‍රමබාහු රජ සමයෙන් පසුව රාජ්‍ය අනුග්‍රහයෙන් කඨින මහෝත්සවයක් පැවැත්වුණු දෙවැනි අවස්ථාව මෙය බව ජනාධිපති කාර්යාලය පවසයි.

කපු වගා කර, නූල් කටිමින්, එම නූලෙන් වියූ කපු රෙදි භාවිත කරමින් කඨින චීවරය මසා පඬුපෙවීමෙන් පසු සාංඝික කිරීම පෙර රජ දවස සිට පැවත එන චාරිත්‍රයකි.

අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ උපදෙස් පරිදි බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය සංවිධාන කළ කඨින චීවර පූජා මහෝත්සවයට පැමිණි ජනාධිපතිවරයා ශ්‍රී මියුගුණාරාම රජමහා විහාරාධිපති ගල්ලැහැපිටියේ පේමරතන හිමියන් බැහැදික උන්වහන්සේගේ සුවදුක් විමසීය.

කඨින චීවරය පඬුපෙවීම, පඬු ගල්වනයට ඖෂධ එක්කිරීම හා පඬුබඳුන සඟ සතු කොට පූජා කිරීම රාජ්‍ය අමාත්‍ය දයාසිරි ජයසේකර මහතා විසින් සිදු කරනු ලැබීය.

පඬුපෙවූ කඨින චීවරය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පෙරහරින් වැඩ කරවා සඟ සතු කොට අනතුරුව පූජා කළේය.

දහවල් දනය පිළිගැන්වීමද ජනාධිපතිවරයා සහ මැති ඇමැතිවරුන් අතින් සිදුකෙරිණි.


කොළඹගම ශ්‍රී මියුගුණාරාම විහාරස්ථානයේ පූජා භූමි අක්තපත්‍රය බුද්ධශාසන කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල ගුණවර්ධන මහතා විසින් කියවනු ලැබීමෙන් අනතුරුව ජනාධිපතිවරයා වයඹ මහා දිසාවේ ප්‍රධාන සංඝනායක ඓතිහාසික තිස්සව රාජමහා විහාරාධිපති මුගුණුවටවන සිද්ධත්ත නාහිමියන්ට පිළිගැන්වූයේය.

සම්බුදු සසුනට කුලදරුවන් පූජා කළ මවුපියන් හය දෙනකුට 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් 'බුදුපුත් මාපිය හරසර' ජාතික වැඩපිළිවෙළේ සමාරම්භය සනිටුහන් කරමින් හැඳුනුම්පත් ලබාදීම ද ජනාධිපතිවරයා අතින් සිදුකෙරිණි.

විහාර භූමියේ පිහිටි පුරාණ විෂ්ණු මහා දේවාලයේ වතාවත්වලට ද ජනාධිපතිවරයා සහභාගි විය.


'බත්ගසට පණ දෙමු' මැයෙන් ගිනි වරකා පැළ ලක්ෂයක් දිවයින පුරා රෝපණය කිරීමේ වැඩසටහනේ සමාරම්භය සනිටුහන් කරමින් ජනාධිපතිවරයා විහාර භූමියේ ගිනි වරකා පැළයක් රෝපණය කළේය. මෙම වැඩසටහනට සමගාමීව දෙවසරක් තුළ කොස් පැළ දස ලක්ෂයක් සිටුවීමේ වැඩසටහන ද ආරම්භ කෙරිණි.

මෙම උත්සවයට අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු, වයඹ පළාත් ආණ්ඩුකාර රාජා කොල්ලුරේ, උතුරු පළාත් ආණ්ඩුකාර ජීවන් ත්‍යාගරාජා, රාජ්‍ය අමාත්‍ය ඩී.බී. හේරත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්වන ගුණපාල රත්නසේකර, ශාන්ත බණ්ඩාර, ආචාර්ය චරිත හේරත්, ඩයනා ගමගේ, සුමිත් උඩුකුඹුර, ජයරත්න හේරත්, දියවඩන නිලමේ නිලංග දැලබණ්ඩාර යන මහත්ම මහත්මීහු ඇතුළු පිරිසක් සහභාගි වූහ.



උත්සවයට සහභාගිවූ අමුත්තන්ගෙන් කොටසක්.

## ගායන ශිල්පී ගාමිණී සුසිරිවර්ධන කලුරිය කරයි



නව පරපුරේ ජනප්‍රිය ගායන ශිල්පියකු වන ගාමිණී සුසිරිවර්ධන මහතා අභාවප්‍රාප්ත විය.

කලක් රෝගාතුරව පසුවූ සුසිරිවර්ධන මහතා මියයන විට 58 වැනි වියෙහි පසුවිය.

සිරස සුපර් ස්ටාර් දෙවැනි අදියරේ අවසන් 12 දෙනා අතරට පැමිණෙමින් ගායන ක්ෂේත්‍රයට පිවිසි ඔහු 'දන්නවද මම දුකින්', 'ආව ගිය තැන් මා හා', 'සල්ලි සල්ලි', 'රතු මැණිකේ' ආදී ගීත ගණනාවක් ගායනා කළේය.

ඔහු 'මගෝ ඩිගෝ ඩයි' චිත්‍රපටයට රංගනයෙන් ද දායක විය.

ගාමිණී සුසිරිවර්ධන මහතා දෙදරු පියෙකි.

දේහය බෙන්තොට, ඊගල්ස්, යාත්‍රාමුල්ල ලිපිනයේ පිහිටි නිවසේ තැන්පත් කර ඇති අතර, අවසන් කටයුතු අද (15) සවස 5.00ට බෙන්තොට ආදාහනාගාරයේදී සිදුකිරීමට නියමිතය.

(ඩයනා උදයංගනී)

# ඉදිරි ඡන්දයේදී ශ්‍රීලනිපය තනිව තරගයට

## අනුරපුර යෝජනාව ඒකමතිකව සම්මතයි

(අනුරාධපුර - දයාරත්න ඇඹෝගම)

ඉදිරි මැතිවරණයේ දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තනිව තරග කළ යුතු බවට වන යෝජනාවක් අනුරාධපුර දිස්ත්‍රික් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ බල මණ්ඩලයේ දී ඊයේ (14) ඒකමතිකව සම්මත කර ගනු ලැබීය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂ අනුරාධපුර දිස්ත්‍රික් බල මණ්ඩලයේ රැස්වීම ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ජාතික සංවිධායක, රාජ්‍ය අමාත්‍ය දුමින්ද දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් අනුරාධපුර ගුවන් තොටුපල මාර්ගයේ පිහිටි පක්ෂ කාර්යාලයේ දී ඊයේ පැවැත්විණි.

එහිදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂ දිස්ත්‍රික් භික්ෂු පෙරමුණ, තරුණ පෙරමුණ, ගොවි පෙරමුණ, ගුරු පෙරමුණ හා කාන්තා පෙරමුණ ඇතුළු දිස්ත්‍රික් අනුබද්ධ සංවිධාන සඳහා නව නිලධාරීන් පත් කර ගැනීම ද සිදුවිය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඉදිරි මැතිවරණයට තනිව තරග කළ යුතුය යන යෝජනාව ඉදිරිපත් කරනු ලැබුවේ පෙරමුණේ නව ලේකම් ලෙස පත් වූ සමන් කුමාර මහතා විසිනි.

සභාවේ සිටි සියලු දෙනාම අත් ඔසවා ඊට එකඟතාව පළ කළහ.

අනතුරුව අදහස් දැක් වූ රාජ්‍ය අමාත්‍ය දුමින්ද දිසානායක මහතා වෙනම තරග කරන්න අවශ්‍යයි කියනවා නම් ආසන සංවිධායකවරුන් දැනුවත් කරන බව කීවේය.

ඉදිරි පළාත් සභා මැතිවරණයට තරග කිරීමට කැමැත්තෙන් පිරිස සිටින්නේ නම් ඒ අය සුදුසුද නැද්ද යන්න බලා ඔවුන් මුණ ගැසීමට පියවර ගන්නා බවද රාජ්‍ය අමාත්‍යවරයා පැවසීය.

හිටපු අමාත්‍ය තිස්ස කරල්ලියද්ද, පාර්ලිමේන්තු මන්ත්‍රී වීරකුමාර දිසානායක යන මහත්වරුද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අනුරාධපුර ආසන සංවිධායකවරුන් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් ඇතුළු පිරිසක් ද මෙම රැස්වීමට එක්ව සිටියහ.

# යුද සමයේ වැළලූ රත්තරන් සොයා රක්ෂිතයක් හෑරූ 6 ක් අත්අඩංගුවට

(ඉන්දිකා රාමනායක)

යුද සමයේ වළදමා ඇතැයි කියන රත්තරං සෙවීම සඳහා මන්නාරම ඔළුතුඩුවාව රක්ෂිත ප්‍රදේශයේ කැණීම් කරමින් සිටි 6 දෙනකු අත්අඩංගුව ගත් බව පොලිසිය පවසයි.

මෙම රක්ෂිත ප්‍රදේශයේ පිරිසක් කැණීම් කරන බවට මන්නාරම 54 වැනි බලසේනා මූලස්ථානයට ලැබුණු තොරතුරකට අනුව හමුදාව සහ පොලිසිය එක්ව සිදුකළ ඒකාබද්ධ මෙහෙයුමකින් මෙම පිරිස පෙරේද (13) අත්අඩංගුවට ගත් බව පොලිසිය සඳහන් කරයි.

සැකකරුවන් පැමිණි බව කියන මෝටර් රථයක්, විදුලි ජනක යන්ත්‍රයක්, කැණීම් කිරීම සඳහා යොද ගන්නා උපකරණ ද මෙම මෙහෙයුමේදී අත්අඩංගුවට ගෙන ඇත. අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 26ත් 60ත් අතර වයස්වල පසුවන බවත් ඔවුන් හෙට්ටිමුල්ල, කුටියාකුඹුර, පානදුර, හල්පෙ යන ප්‍රදේශවල පදිංචිකරුවන් බවත් පොලිසිය පවසයි.

සැකකරුවන් මන්නාරම මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

## වකුගඩුවක් පිරිනමා ජීවිතයක් බේරාදෙමු

ආරක්ෂක අංශයේ සේවයේ නියුතුව සිට විශ්‍රාම ලබා එඬේරමුල්ල ප්‍රදේශයේ පදිංචි ඩී.එම්.ඩී.ජේ.ටී. ප්‍රියලාල් මහතා දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන අතර ඔහුට ඕ පොසිටිව් හෝ ඕ නොගටිව් වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු බවට වෛද්‍යවරුන් නිර්දේශ කර ඇත.

වකුගඩුවක් පරිත්‍යාග කිරීමට කැමති පරිත්‍යාගශීලියකු වෙත්නම් 0776499417 හෝ 0773025887 යන දුරකථන අංකවලට දැනුම් දෙන ලෙසට ඔහුගේ පවුලේ ඥාතීහු ඉල්ලීමක් කරති.

# මත් ජාවාරම්මු 4 ක් ඉරණවිලදී අත්අඩංගුවට

(ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය)

මත්ද්‍රව්‍ය ජාවාරමේ නිරතව සිටි බව කියන පුද්ගලයන් හතර දෙනකු හලාවත ඉරණවිල ප්‍රදේශයේදී සැකපිට ඊයේ (14) අත්අඩංගුවට ගත් බව හලාවත කොට්ඨාස විෂ මත්ද්‍රව්‍ය අංශය පවසයි.

ඔවුන් සිවුදෙනා සන්තකයේ තිබී වෙළෙඳපොළ වටිනාකම රුපියල් ලක්ෂයක් පමණ වටිනා හෙරොයින් මත්ද්‍රව්‍ය සොයාගත් බව හලාවත මූලස්ථාන පොලිසියේ නිලධාරියෙක් 'ලංකාදීප'යට පැවැසීය.

මෙම සැකකරුවන් හතර දෙනා හෙරොයින් මත්ද්‍රව්‍ය සමග අත්අඩංගුවට ගැනීමට හැකිවූයේ පොලිස් විශේෂ කාර්යාංශයේ හලාවත උප ඒකකයේ බුද්ධි නිලධාරියකුට ලැබුණු තොරතුරක් මත කරන ලද වැටලීමක ප්‍රතිඵලයක් වශයෙනි.

මෙසේ සැකපිට අත්අඩංගුවට ගනු ලැබ ඇත්තේ කොළඹ මට්ටක්කුලිය සහ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ සේදවත්ත යන ප්‍රදේශවල පදිංචි දෙදෙනකු සහ හලාවත ඉරණවිල ප්‍රදේශයේ පදිංචිකරුවන් දෙදෙනෙකි.

හලාවත කොට්ඨාසය බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ලලිත් රෝහණ ගමගේ මහතාගේ උපදෙස් මත මෙම වැටලීම සිදුකරන ලැබුවේ හලාවත කොට්ඨාස විෂ මත්ද්‍රව්‍ය නිවාරණ අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක බිමල් මහතා ප්‍රධාන පොලිස් කණ්ඩායමක් විසිනි.

# බිලූමැන්ඩල් සංබගේ රට ගිනි අවියක් එක්ක ක්‍රීඩා උපදේශකයෙක් දැලේ

(ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය සහ ඉන්දිකා රාමනායක)

ඩුබායි රටට පලාගොස් සැඟවී සිටින පාතාල කල්ලි නායකයකු බව කියන සංබ ශිරන්ත හෙවත් බිලූ මැන්ඩල් සංබ නමැත්තාට අයත් බව කියන ඉතාලියේ නිෂ්පාදිත රිවෝල්වරයක් සහ ක්‍රීඩා උපදේශකවරයකු පන්නිපිටිය ප්‍රදේශයේදී පෙරේද (13) අත්අඩංගුවට ගත් බව පොලිස් විශේෂ කාර්ය බළකාය පවසයි.

බිලූ මැන්ඩල් සංබ නමැත්තා රටින් පලා යාමට කළින් ඔහු පරිහරණය කළ බව කියන මෙම රිවෝල්වරය ඔහුගේ සමීපතම ගෝලයකු වන තොට ළඟ චනා නමැත්තාට බාර දී ගොස් තිබිණි යැයි පොලිස් විශේෂ කාර්ය බළකායේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙක් කීය.

තොටළඟ චනා නමැත්තා ද රටින් පලාගොස් ඇති අතර ඔහු එසේ රටින් ද පලා යෑමට කළින් බිලූ මැන්ඩල් සංබට බාරදී තිබූ මෙම රිවෝල්වරය පන්නිපිටියේදී අත්අඩංගුවටගත් සැකකාර ක්‍රීඩා උපදේශකවරයාට බාර දී ගොස් ඇතැයි විශේෂ කාර්ය බළකාය පවසයි.

ඉතාලියේ නිෂ්පාදිත මෙම රිවෝල්වරය සමග සැකපිට අත් අඩංගුවට ගෙන ඇත්තේ පන්නිපිටිය දෙපානම ප්‍රදේශයේ පදිංචි අවුරුදු 46 වයසේ පසුවන අයෙකි.

පොලිස් විශේෂ කාර්ය බළකායේ අණදෙන නිලධාරී නියෝජ්‍ය පොලිස්පති නීතිඥ වරුණ ජයසුන්දර මහතාගේ උපදෙස් මත නියෝජ්‍ය අධ්‍යක්ෂ (විශේෂ මෙහෙයුම්) සහකාර පොලිස් අධිකාරී ඩී.පී.යූ. කොඩිතුවක්කු මහතාගේ මෙහෙයවීම යටතේ සංවිධානාත්මක අපරාධ මර්දන ඒකක (02) ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සී.ආර්. පාරමුල්ලගේ මහතා ප්‍රධාන පොලිස් කණ්ඩායමක් මෙම වැටලීම සිදුකර ඇත.

# කොවිඩ් රෝගීහු 695 ක් අලුතෙන්

(යොහාන් භාසුර)

කොවිඩ් ආසාදිතයන් තවත් 695 දෙනකු ඊයේ (14) අලුතින් හඳුනාගත් බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා නිවේදනය කළේය.

ඒ අනුව, මෙරටින් වාර්තාවන කොවිඩ් රෝගීන්ගේ මුළු සංඛ්‍යාව 549,289 ක් බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වාර්තාවේ දැක්වේ.

කොවිඩ් ආසාදිත වී ප්‍රතිකාර ලබමින් සිටි, කොවිඩ් රෝගීන් තවත් 426 දෙනකු සුවය ලබා රෝහල්වලින් ඊයේ (14) පිටව ගොස් ඇති අතර, මේ වනවිට මෙරට සුවය ලැබූ රෝගීන්ගේ මුළු සංඛ්‍යාව 523,929 ක් දක්වා ඉහළ ගොස් ඇතැයි සෞඛ්‍ය අංශ සඳහන් කරයි.

# කොවිඩ් මරණ තව 23 ක්

(යොහාන් භාසුර)

කොවිඩ් ආසාදිත වූ, රෝගීන් තවත් 23 දෙනකු පෙරේද (13) මරණයට පත් වී ඇතැයි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ඊයේ (14) තහවුරු කළේය.

ඒ සමඟ මෙරටින් වාර්තාවන කොරෝනා ආසාදිත මරණ මුළු සංඛ්‍යාව 13,995 දක්වා ඉහළ ගියේය.

වයස අවුරුදු 60 ට වැඩි 17 දෙනකු, වයස අවුරුදු 30ත් 59ත් අතර හය දෙනකු ද මියගිය අය අතර වන බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වාර්තාවේ දැක්වේ.

මියගිය පිරිස අතර පිරිමින් 10 දෙනකු සහ කාන්තාවන් 13 දෙනකු සිටින බව ද එම වාර්තාවේ සඳහන් වේ.

## දිල්ලි නගරය දුමාරයෙන් වැසේ: පාසල් වහයි

1 වැනි පිටුවෙන්

වායු දූෂණය ඉහළ යෑමත් සමඟ මේ වන විට අගනුවර දෛනික කටයුතුවලට බාධා එල්ල වී ඇති අතර, පාසල් ද වසා දැමීමට බලධාරීන් පියවර ගෙන ඇත.

වෛද්‍යවරුන් උපදෙස් දී ඇත්තේ, කුඩා දරුවන් හැකිතාක් නිවෙස්වල රඳවා තබා ගන්නා ලෙසය. නවදිල්ලි අගනුවර වායු දූෂණය අවම කිරීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉන්දීය අගවිනිසුරුවරයා මධ්‍යම රජයට දන්වා තිබේ.

ඉන්දීය අගවිනිසුරු එන්.වී. රාමනා් මෙසේ මධ්‍යම රජයට දැනුම් දුන්නේ, කාලගුණ විද්‍යාඥයන් සහ පරිසරවේදීන් ලබාදුන් දත්ත සහ වාර්තා අධ්‍යයනය කිරීමෙන් අනතුරුවය.

පසුගිය 2018, 2019 සහ 2020 වසරවලදී නවදිල්ලි අගනුවර දීවාලි උත්සව සැමරීම සිදු වූයේ, ගිනි කෙළි දැල්වීම හෝ පිදුරු ගිනි තැබීම සීමා කිරීමත්, තහනම් කිරීමත් යටතේය.

ඒ, වායු දූෂණයේ වැඩි වීමක් පෙන්නුම් කළ බැවිනි. එය දැඩි ජනතා විරෝධයට හේතුවක් විය. එසේ වුවත්, ගිනි කෙළි දැල්වීමට එරෙහිව පැනවූ තහංචි හේතුවෙන්, පසුගිය 2020 වසරේ දී වායු දූෂණය වේගයෙන් පහළ ගියේය. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ජනතා ඒකරාශි වීම සීමා වීම ද වායු දූෂණය අඩු වීමට තවත් හේතුවක් විය.

මේ වසරේ කොවිඩ් 19 අවදානම අඩු වී ඇති බැවින් නවදිල්ලි අගනුවර වැසියෝ මහත් උත්සවශ්‍රීයෙන් දීවාලි සැමරුම් පැවැත්වූහ. ඒ, පරිසරවේදීන්ගේ අනතුරු ඇඟවීම් නොසලකා හරිමිනි. ගිනි කෙළි දල්වමින්, පිදුරු ගිනි තබමින් දීවාලි සැමරුම් නොකඩවා පැවැත්වෙද්දී වායු දූෂණය අනපේක්ෂිත ආකාරයට ඉහළ ගොස් නගරය විෂ දුමාරයකින් වැසී ගිය බව ඉන්දීය මාධ්‍ය වැඩිදුරටත් පැහැදිලි කර තිබේ.

කාලගුණ විද්‍යාඥයන් සහ පරිසරවේදීන් කළ විමර්ශනයකින් හෙළි වී ඇත්තේ, නවදිල්ලි වැසියන්ගෙන් සියයට 80ක් දැඩි හිසරදයෙන් සහ ශ්වසන ආබාධවලින් පෙළෙන බවය.

වායු දූෂණයෙන් වැඩිම බලපෑම එල්ල වන්නේ, ගැබිනි මවුවරුන්ටය. වාතයේ විෂ සංඝටක මවු කුස තුළ සිටින දරුවන් දැඩි ලෙස රෝගී කරන බව වෛද්‍යවරු පෙන්වා දෙති.

වායු දූෂණය හේතුවෙන් වාර්ෂිකව ඉන්දියාවේ ලක්ෂ 10කට වැඩි පිරිසක් මියයන බව ද වෛද්‍යවරු පැහැදිලි කරති.

ලොව වැඩිම වායු දූෂණය සහිත නගර ලැයිස්තුවේ ඉහළින්ම ඇත්තේ නවදිල්ලි අගනුවරය.

## කොන්ත්‍රාත්තුවේදී කෝටි 28 ක අත යට ගනුදෙනුවක්

1 වැනි පිටුවෙන්

පළමුව සකස්කළ ඉංජිනේරු ඇස්තමේන්තුව නිවැරදිව සකස් වී නොමැති බවද මෙහිදී සඳහන් විය. එබැවින් ඇස්තමේන්තුව සකස් කළ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට විරුද්ධව ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරන ලෙස කෝපා කමිටුව නිර්දේශ කළේය.

මේ අතර කුරුණෑගල බස් නැවතුම්පොළෙහි මගී ජනතාවට පහසුවෙන් රැඳී සිටීමට වෙන්කර ඇති හිස් භූමියේ ව්‍යාපාරිකයන් 31 දෙනකුට කඩ කාමර 31 ක් පෞද්ගලික වියදමින් ඉදිකර ගැනීමට අවසරදී ඇතැයි කියන සිද්ධියක් සම්බන්ධයෙන්ද තොරතුරු අනාවරණය වී ඇත.

කුරුණෑගල මධ්‍යම වෙළෙඳපොළේ අදියර 1 හා 2 යටතේ ඉදි කරමින් පවතින කඩ කාමර 123 ක් හා මාලිගාපිටියේ කඩකාමර 12 ක් දීර්ඝ කාලීන බදු ක්‍රමය යටතේ නිවැරදි ක්‍රමවේදයකින් තොරව ලබාදීම පිළිබඳවද මෙහිදී දීර්ඝ ලෙස සාකච්ඡාවට ලක්විය.

මෙම තොරතුරු අනාවරණය වූයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව රාජ්‍ය අමාත්‍ය දයාසිරි ජයසේකර මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේදී පසුගිය 10 වැනිද රැස්වූ අවස්ථාවේදීය.

රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිත්වය දරන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය තිස්ස විතාරණ මහතාය.

මෙම ඉදිකිරීම් ආර්ථික උත්පාදන මාර්ගයක් බවට මහ නගර සභාව අර්ථ දක්වා තිබුණද මෙමගින් ජනතාවගේ පොදු යහපතට බාධා සිදුවන බව කෝපා කමිටුවේදී තොරතුරු අනාවරණය විය.

එසේම ඉලුප්පුගෙදර මාර්ගය කොන්ක්‍රීට් කිරීම සම්බන්ධයෙන් ඇස්තමේන්තු දෙකක් සකස් කිරීම පිළිබඳවද මෙහිදී සාකච්ඡාවට භාජන විය.

මීට අමතරව ව්‍යාජ ආයතනයකින් පොලිසැක් මලු මිලදී ගැනීම පිළිබඳවද කෝපා කමිටුවේ අවධානය යොමු විය.

මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ කුරුණෑගල මහනගර සභාවේ නගරාධිපති පවසා ඇත්තේ අදාළ පනත් විධි විධානවලට අනුව කටයුතු කර ඇති බවයි.

මෙම කාරක සභා රැස්වීමට රාජ්‍ය අමාත්‍යවරුන් වන ලසන්ත අලගියවන්න ෂෙහාන් සේමසිංහ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්වන අශෝක් අබේසිංහ, ගුණපාල රත්නසේකර, කාදර් මස්තාන්, වීරසුමන වීරසිංහ, වෛද්‍ය උපුල් ගලප්පත්ති යන මහත්වරුද සහභාගි වූහ.

## මුං ඇට කිලෝව රු. 225 ට සතොසෙන්

1 වැනි පිටුවෙන්

ජනාධිපතිවරයා ඒ සඳහා උපදෙස් ලබාදී ඇතැයි පැවසූ ගුණවර්ධන මහතා රජය මුං ඇට ආනයනය නතර කිරීම නිසා දේශීය මුං ඇට නිෂ්පාදනය ඉහළ ගිය බවද සඳහන් කළේය.

මුං ඇට කිලෝවක් රුපියල් 450ට මිලදී ගෙන 225ට ලබාදෙන බවත් රුපියල් 98ට නාඩු සහල් සතොස වෙළෙඳසල් හරහා දිගටම අලෙවි කරන බවත් ඔහු පැවසුවේය.

පසුගිය ආණ්ඩුව රුපියල් කෝටි ගණන් වැයකර සහල් ආනයනය කළ බවද බන්දුල ගුණවර්ධන මහතා කීවේය.

වෙළෙඳ ඇමැතිවරයා මෙසේ පැවසුවේ අයවැය දෙවැනි වර කියැවීමේ විවාදයට එක්වෙමිනි.

(සුජිත් හේවාජුලිගේ සහ අංජුල මහික වීරරත්න)

# සෞඛ්‍ය නීතිවලට අනුකූලව සිරිපා වඳින්න එන්න

## ශ්‍රීපාදස්ථානාධිපති හිමියෝ ඉල්ලති

(අජිත්ලාල් ශාන්තඋදය)

කොරෝනා වසංගත තත්ත්වයෙන් ආරක්‍ෂා වෙමින් සෞඛ්‍ය අංශ ලබාදෙන උපදෙස් නිසියාකාරව පිළිපදිමින් ලබන උඳුවප් පුන් පොහොය දිනයෙන් ආරම්භ වන 2021/22 සිරිපා වන්දනා සමයේ සිරිපා කරුණා කරන්නට එක්වන්නැයි ශ්‍රීපාදස්ථානාධිපති ඌව - වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කුලපති බෙංගමුවේ ධම්මදින්න හිමියෝ 08ද සමස්ත බැතිමතුන්ගෙන් ඉල්ලා සිටියහ.

මෙවරත් සිරිපා වන්දනා සමය සාර්ථක කරගැනීමට දිසාපතිවරුන් ඇතුලු සියලුම රාජ්‍ය නිලධාරීන්ගෙන් හා අනෙකුත් සංවිධාන වලින් රාජකාරියට එහා ගිය සහයෝගයක් ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වන බවද උන්වහන්සේ පැවසූහ.

ලබන සිරිපා වන්දනා වාරය (2021/22) ආරම්භ කිරීම සම්බන්ධයෙන් 18ද රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවනාගාරයේ පැවති විශේෂ සාකච්ඡාවේ මුලසුන හොබවමින් ශ්‍රීපාදස්ථානාධිපති නා හිමියෝ මෙම ඉල්ලීම කළහ.

එළැඹෙන දෙසැම්බර් 18දිනට යෙදෙන උඳුවප් පුන් පොහොය දිනයෙන් ආරම්භ වන 2021/22 සිරිපා වන්දනා වාරය 2022 වසරේ මැයි මාසයේ එළඹෙන වෙසක් පුන් පොහොය දිනයෙන් අවසන් වෙයි.

සිරිපා වන්දනා සමය ආරම්භ කිරීමට පෙර සිදුකරනු ලබන ආගමික පූජා කටයුතු දෙසැම්බර් 16 දින සවස් වරුවේ සිට පැල්මඩුල්ල ගල්පොත්තාවල ශ්‍රීපාද රජමහා විහාරස්ථානයේ දී පැවැත්වීමට ද නියමිතය.

සිරිපා වන්දනා වාරය අවසන් කිරීමෙන් පසු ආපසු වැඩම කර තැන්පත් කර තිබූ සුමන සමන් දෙවියන්ගේ ප්‍රතිමා, දේවාභරණ ඇතුලු පූජාභාණ්ඩ එදින සවස සිට දැක බලාගෙන වන්දනාමාන කිරීමට ද බැතිමතුන්ට අවස්ථාව හිමිවෙයි. ඒ සියල්ලක්ම සෞඛ්‍ය නීති සහ උපදෙස් අනුව පමණක් සිදුකෙරෙයි.

ඒ අනුව සිරිපා වන්දනාවාරය ආරම්භ කිරීම සඳහා පැල්මඩුල්ල ගල්පොත්තාවල ශ්‍රීපාද රජමහා විහාරස්ථානයේ පිහිටි සමන් දේවාලයේ තැන්පත් කර ඇති සධාතුක කරඬු, සුමන සමන් දෙවියන්ගේ ප්‍රතිමා, දේවාභරණ ඇතුලු පූජා භාණ්ඩ, හැටන්, රත්නපුර, ශ්‍රීපලාබද්දල, කුරුවිට, එරත්න සහ බළන්ගොඩ යන මාර්ග හතර ඔස්සේ ලබන දෙසැම්බර් 17 දින අලුයම වැඩම කරවීමට නියමිතය.

සෞඛ්‍ය උපදෙස් නීති රීතිවලට අවනතව සිරිපා කරුණා කිරීමට අදහස් කරන බැතිමතුන් ස්ලාස්ටික්, පොලිතීන් වැනි දිරාපත් නොවන අපද්‍රව්‍ය සිරිපා අඩවියට බැහැර නොකරන ලෙස රත්නපුර දිස්ත්‍රික් ලේකම් මාලනී ලොකුපෝතාගම මහත්මිය කාරුණිකව ඉල්ලා සිටින්නීය.

සිරිපා වන්දනාවාරය ආරම්භ කරමින් විදුලිය, ජලය, සෞඛ්‍ය, ආරක්‍ෂාව ආදී වූ විවිධ වූ සේවාවන් සපයන ආයතනවල වගකීම් ඉටුවන ආකාරය පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කෙරුණි.

රත්නපුර දිස්ත්‍රික් ශාසනාරක්‍ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරී හිමියන් ප්‍රධාන මහා සංඝරත්නය, රත්නපුර දිස්ත්‍රික් ලේකම් මාලනී ලොකුපෝතාගම, නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් නන්දන ගලබඩ, රත්නපුර අතිරේක දිස්ත්‍රික් ලේකම් නීතිඥ එස්.බී. උඩෝවිට, සබරගමුව පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම්වරුන්, රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික් දෙකේ පොලිස් ප්‍රධානීන්, බස්නායක නිලමේවරුන්, කුරුවිට යුදහමුද කඳවුරේ ප්‍රධානීන් ඇතුලු අත්‍යවශ්‍ය සේවාවන් සපයන ප්‍රාදේශීය ලේකම්වරු ඇතුලු ආයතනවල ප්‍රධානීහු රැසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

# ඉන්දුනීසියානු සංචාරකයකු කොල්ලුපිටිය හෝටලයක් අසලදී පැහැරගෙන

(ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය)

**මෙරට සංචාරයක් සඳහා පැමිණ සිටි ඉන්දුනීසියානු ජාතිකයකු කිසියම් පිරිසක් විසින් ඊයේ (14) අලුයම කොල්ලුපිටිය ප්‍රදේශයේ පිහිටි හෝටලයක් අසලදී පැහැර ගෙන ගොස් ඇති බව කොල්ලුපිටිය පොලිසිය කියයි.**

පැහැර ගැනීමට ලක්වූ ඉන්දුනීසියානු ජාතිකයාගේ බිරිඳ වන ඉන්දුනීසියානු ජාතික ඉන්ඩා ඔක්ටවියා මහත්මිය මේ බව කොල්ලුපිටිය පොලිසියට පැමිණිලි කළාය.

මෙසේ පැහැරගෙන ගොස් ඇත්තේ අමීර් ෂාහිඩ් නමැත්තෙකි.

වැගන් ආර් වර්ගයේ වෑන් රථයකින් ආ කිසියම් පිරිසක් තම සැමියා පැහැරගෙන ගොස් ඇති බව ඔහුගේ බිරිඳ පොලිසියට කළ පැමිණිල්ලේ සඳහන් වන්නේ යැයි ද ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙක් 'ලංකාදීප'යට පැවැසීය.

කොල්ලුපිටිය පොලිසියේ නිලධාරීන් කණ්ඩායමක් මෙම ඉන්දුනීසියානු ජාතිකයා සොයා ගැනීමට සහ ඔහු පැහැර ගෙන ගිය පුද්ගලයා අත්අඩංගුවට ගැනීමට පුළුල් පරීක්ෂණ පවත්වයි.


# ගුරු විදුහල්පති සමිති සටන ජනවාරි 20 තෙක් නවත්වයි

(යොහාන් භාසුර)

**ගුරු - විදුහල්පති වැටුප් විසමතා සම්බන්ධයෙන් අයවැය ලේඛනයෙන් දුන් පොරොන්දු ඉටු කරන තෙක් ලබන වසරේ (2022) ජනවාරි මස 20 වැනිද දක්වා වෘත්තීය ක්‍රියාමාර්ගය තාවකාලිකව අත්හිටුවන බව ගුරු - විදුහල්පති වෘත්තීය සංගම් ඊයේ (14) පැවසීය.**

ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් ජෝෂප් ස්ටාලින් මහතා පැවසුවේ අයවැයෙන් දුන් පොරොන්දු ඉටුකිරීම සඳහා රජය වහාම චක්‍රලේඛ නිකුත් කළ යුතු බවත් වැඩිවන වැටුප ලබන වසරේ ජනවාරි මස 20 වැනිද ලබාදිය යුතු බවත්ය.

රජය එම පොරොන්දුව ඉටු නොකළහොත් නැවතත් වෘත්තීය ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වන බව ද ජෝෂප් ස්ටාලින් මහතා සඳහන් කළේය.




# ටෙන්ඩර් දැන්වීමයි

**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

**සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙහි දුරකථන ඇමතුම් මධ්‍යස්ථානය, මහජන සම්බන්ධතා හා විමසීම් කවුළු සේවා සැපයීම පිණිස මිල ගණන් කැඳවීමයි**

1. ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ දුරකථන ඇමතුම් මධ්‍යස්ථානය, මහජන සම්බන්ධතා හා විමසීම් කවුළු පවත්වාගෙන යාම සඳහා පිළිගත් හා රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයන්හි දුරකථන ඇමතුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යාම, මහජන සම්බන්ධතා හා විමසීම් කවුළු සේවා සැපයීම පිළිබඳව පළපුරුදු ආයතනයන්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

2. 2021.11.15 දින සිට 2021.12.03 දින අතර බැංකු කටයුතු සිදු කරනු ලබන දිනයන්හි දී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ නො 13, ලොයිඩ්ස් ගොඩනැගිල්ල, සර් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01 හි පිහිටි, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ මහජන සම්බන්ධතා හා විමසීම් කවුළුවෙන්, අදාළ ටෙන්ඩර පත්‍රිකා ලබා ගත හැකිය. එසේත් නැතිනම්, ශ්‍රී ලංකා මහ බැංකු නිල වෙබ් අඩවියේ (www.cbsl.gov.lk) "ටෙන්ඩර් දැන්වීම්" යටතේ හෝ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ (www.epf.lk) "සේ.අ.අ. ටෙන්ඩර්" යටතේ අදාළ ටෙන්ඩර් පත්‍රිකා බාගත කල හැකිය.

3. මිල ගණන් කැඳවීමට අදාළ ටෙන්ඩර් පත්‍රිකා බහාලන කවරයේ ඉහළ වම් කෙළවර, "ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙහි දුරකථන ඇමතුම් මධ්‍යස්ථානය, මහජන සම්බන්ධතා හා විමසීම් කවුළු සඳහා සේවා සැපයීම" යනුවෙන් සඳහන් කොට ශ්‍රී ලංකා මහ බැංකුවේ බිම් මහලෙහි පිහිටි තැපැල් අංශයේ ටෙන්ඩර් බහාලුම වෙත දැමිය හැකිය. නොඑසේ නම්, අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, 12 වන මහල, 5 වන කුළුණ, ශ්‍රී ලංකා මහ බැංකුව, නො.30, ජනාධිපති මාවත, කොළඹ 01 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය හැකිය.

4. 2021.12.03 දින ප.ව. 2.30 ට ටෙන්ඩර් කැඳවීම අවසන් කරනු ලබන අතර, ඒ විගස ශ්‍රී ලංකා මහ බැංකුව, නො.30, ජනාධිපති මාවත, කොළඹ 01 හි 5 වන කුළුණේ, 12 වන මහලේ, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ රැස්වීම් ශාලාව තුළ දී ලංසු පත්‍රිකා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුට හෝ බලයලත් නියෝජිතයෙකුට ශ්‍රී ලංකා මහ බැංකුවේ පවතින ආරක්ෂක විධිවිධානවලට සහ මහ බැංකුව විසින් අනුගමනය කරනු ලබන කොවිඩ් -19 වැළැක්වීමේ මාර්ගෝපදේශන ක්‍රම වලට යටත්ව එම අවස්ථාවට සහභාගී වීමට හැකිය.

5. දුරකථන අංක 011-2477969/011-2477962 ඔස්සේ ආයතනික සේවා හා පරිපාලන අංශයේ සහකාර අධිකාරී ඇමතීමෙන් වැඩි විස්තර ලබා ගත හැකිය. විද්‍යුත් තැපෑල: tenders.epf@cbsl.lk

**අධිකාරී**
**සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව,**
**නො.30, ජනාධිපති මාවත, කොළඹ 01**
**දුරකථන : 0112477969, 0112477962 විද්‍යුත් තැපෑල : tenders.epf@cbsl.lk වෙබ් අඩවිය: www.epf.lk**






# අයවැයකින් පසු හැමදාම කරන්නේ අවලාද පමණක් නම් ජාතිය වැටී ඇති අර්බුදයෙන් කිසිද ගොඩඑනු බෑ

**ආචාර්ය බන්දුල ගුණවර්ධන**

# අයවැය මෙලෝ රහක් නැති පුස් ලියවිල්ලක්: මේ දත්ත විජ්ජා අපට පිළිගන්න බෑ

**ආචාර්ය හර්ෂ ද සිල්වා**






## මෙවැනි සාර්ථක සමබර අයවැයක් ගේන්න හැකිවේ යැයි අප සිතුවේ නෑ

**ශාන්ත බණ්ඩාර**





## මේ ආණ්ඩුව දුවන්නේ එදවේල ටුවර්ස් විදියටයි

**කබීර් හෂීම්**

## රාජ්‍ය ව්‍යාපාර තිස් දෙකක් රටට අලාභ ගෙනදෙනවා

**මහාචාර්ය චරිත හේරත්**






## රටේ පහළ පන්තියේ ජනතාව ඉතා අසීරු අඩියකට දමලා

**මුජිබුර් රහුමාන්**

## නිෂ්පාදන ආර්ථිකයට යොමුවීම මේ අයවැයෙන් ශක්තිමත් කරලා

**ඉසුරු දොඩන්ගොඩ**





## සංවර්ධනය සුබසාධනය නැති වචන හරඹයක් ඉදිරිපත් කළා

**විජිත හේරත්**

(අංජුල මහික වීරරත්න සහ සුපිත් හේවාජුලිගේ)

**අයවැය ලේඛනයකින් පසුව හැමදාම කරන්නේ අවලාද උපහාස පමණක් නම් ජාතිය වැටී ඇති අර්බුදයෙන් කිසි දිනෙක ගොඩඒමට නොහැකි බව වෙළෙඳ අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා පාර්ලිමේන්තුවේ දී පෙරේදා (13) පැවැසීය.**

වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා සෙංකෝලය තැන්පත් කිරීමෙන් අනතුරුව කතානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුව පෙරේද (13) පෙරවරු 9.30ට රැස්විය.

කතානායකවරයාගේ නිවේදන සහ ලිපිලේඛනාදිය පිළිගැන්වීමෙන් අනතුරුව 2022 විසර්ජන පනත් කෙටුම්පත දෙවැනි වර කියවීමේ විවාදය ඇරඹිණ.

**කොළඹ දිස්ත්‍රික් මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා (සජබ):-**

බැසිල් රාජපක්ෂ අයවැය ඉදිරිපත් කරමින් පවුල් පසුබිම ගැන කතා කළා. වරප්‍රසාද ලත් පෙළපත ගැන කතා කළා. අපට නම් එහෙම නෑ. අපි නියෝජනය කරන්නේ සාමාන්‍ය මැද පන්තියයි. මුදල් ඇමැතිගේ අයවැය මෙලෝ රහක් නැති පුස් ලියවිල්ලක්. රාජපක්ෂවරුන්ගේ අසාර්ථකත්වය මුදල් ඇමැති මුළු ලෝකයටම පෙන්නුවා. මේ දත්ත විජ්ජා අපට පිළිගන්න බැහැ. මහ බැංකු වාර්තාවේ දැක්වෙන අයවැය පරතරයට වඩා සත්‍ය අයවැය පරතරය රුපියල් බිලියන 840 කින් වැඩියි. මෙය තනිකර පහත් දේශපාලන ක්‍රියාවක්. 2022 අයවැය පරතරය විගණකාධිපති වාර්තා අනුව 14.2 පමණ වෙනවා. අයවැයෙන් ඉදිරිපත් කළ ගණනත් වැරදියි. ආදයම් වැඩි කර පෙන්වන වියදම අඩුකර පෙන්වන මේ බොරුව මොකද්ද? ඉතිහාසයේ මේ තරම් ජනතාව මුළා කළ යුගයක් අපට තවත් මතක නැහැ. ජනාධිපති සියලු බලතල ඉල්ලුවා. ඒ සියල්ලම ලැබුණා. දැන් විපක්ෂය උදවු කරන්නේ නැතැයි කියනවා. ආණ්ඩුවක් අවශ්‍ය වන්නේ රට නිසි වැඩපිළිවෙළක් ඇතිව ඉදිරියට ගෙන යන්නයි. මේ ආණ්ඩුවට කිසිම වැඩපිළිවෙළක්, දැක්මක්, ප්‍රතිපත්තියක් නැහැ. මේ සතියට පමණක් ගැසට් දෙකක් රිවස් කර තිබෙනවා. මෙහෙම රටක් ගෙනියන්න පුළුවන්ද?

(අජිත් රාජපක්ෂ මහතා මුලසුනට පැමිණේ)

**වෙළෙඳ අමාත්‍ය බන්දුල ගුණවර්ධන මහතා:-**

හර්ෂ ද සිල්වා මහතා දේශපාලන කතාවක් මිස අයවැය ගැන විද්‍යාත්මක කතාවක් නොකිරීම ගැන කනගාටු වෙනවා. හැමදම අයවැය ලේඛනයකින් පසුව අවලාද උපහාස පමණක් කරනවා නම් ජාතිය වැටී ඇති අර්බුදයෙන් ගොඩ එන්න බැහැ. අවුරුදු හතළිහක් පනහක් ගියත් පාර්ලිමේන්තුවේ රාජ්‍ය මූල්‍ය හැසිරීම සම්බන්ධයෙන් වගකීම් කරන්නට නොහැකි වී තිබෙන බව පිළිගත යුතුයි. මීට පෙර ලංකාවේ කිසිම මුදල් ඇමැතිවරයෙක් මෙවැනි වසංගත තත්ත්වයක් මැද අයවැයක් ඉදිරිපත් කර නැහැ. මේ ගෝලීය අර්බුදයක් තිබෙන වකවානුවක් බව අමතක කරන්න බැහැ. ඒ නිසා අභියෝගාත්මක කාර්යයක් කළ මුදල් ඇමැතිවරයෙක් ලෙස බැසිල් රාජපක්ෂ ඉතිහාසගත වෙනවා. ආසියාවේ එන්නත්කරණය සම්බන්ධයෙන් ලංකාව පළමු තැනට පත්ව තිබෙනවා. මහින්ද රාජපක්ෂ මේ රටේ සියලු ජනතාවට අභය දානය දුන්නා සේ ගෝඨාභය රාජපක්ෂ කොරෝනා වසංගතයෙන් ජනතාව ගලවා ගත්තා.

**කුරුණෑගල දිස්ත්‍රික් මන්ත්‍රී ශාන්ත බණ්ඩාර මහතා (පොපෙ) :-**

මෙවැනි සාර්ථක සමබර අයවැයක් ඉදිරිපත් කරන්න හැකිවේයැයි මන්ත්‍රීවරුන් ලෙසත් අප සිතුවේ නැහැ. අප සිතුවේ ජනතාවට බර පැටවෙනු ඇති බවයි. නමුත් බැසිල් රාජපක්ෂ මහතා සූර සරදියෙල් වගේ තියෙන අයගෙන් අරගෙන නැති අයට ලබා දී තිබෙනවා. සූර සරදියෙල් කළේ නීති විරෝධී ලෙසයි. බැසිල් රාජපක්ෂ මහතා කරන්නේ නීත්‍යානුකූල ලෙසයි. වෙනස එයයි. මේ අයවැය නිසා විපක්ෂයේ බලාපොරොත්තු සුන් වී තිබෙනවා. මේ අයවැයට විරුද්ධ ඡන්දය දෙන්නේ ගුරු විදුහල්පති වැටුප් විසමතාව විසඳීමට විරුද්ධ අයයි.

**ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රී විජිත හේරත් මහතා (ජාජබ) :-**

අයවැයෙන් පෙරළියක් වේ යැයි ජනතාවත් හිතුවා. නමුත් ඉදිරිපත් කළේ ජනතාවට දඩිය දමා කලන්තය හැදෙන අයවැයක්. ආර්ථිකයෙන් තෙරපිලා ඉන්න වෙලාවේ යම් සහනයක් බලාපොරොත්තු වුණත් කිසිවක් නැහැ. එහි සංවර්ධන අයවැයක් හෝ සුබසාධන අයවැයක් නැහැ. වචන හරඹයක් ඉදිරිපත් කර තියනවා. 2021 පළමු කාර්තුවේ කොරෝනා තිබුණේ නැහැ. නමුත් මේ කාලයේදී කෘෂිකර්මාන්තය සියයට 5.6 කඩා වැටී තිබෙනවා. සමස්ත ආර්ථිකය 1.7 කින් පළමු කාර්තුවේ දී කඩා වැටී තිබෙනවා. හාල් මිල නැග්ගේ කොරෝනා නිසාද? හාල් මාෆියාව මෙල්ල කරගන්න බැරි වුණා. ඇත්ත කතාව එයයි.

(නියෝජ්‍ය කාරක සභා සභාපති අංගජන් රාමනාදන් මහතා මුලසුනට පැමිණේ)

**මාතර දිස්ත්‍රික් මන්ත්‍රී වීරසුමන වීරසිංහ මහතා (පොපෙ) :-**

ගෝලීය සහ දේශීය ආර්ථික අර්බුදයන් පිළිබඳව, ඇති නැති පරතරයන් පිළිබඳව අයවැය කතාවෙන් බැසිල් රාජපක්ෂ මහතා කතා කළා. එවැනි පරිසරයක් ඇතුළත මීට වඩා දෙයක් ඉදිරිපත් කළ හැකිදැයි හෘද සාක්ෂිය විමසන ලෙස විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා. මෑත ඉතිහාසයේ ඉදිරිපත් කළ හොඳ අයවැයක් ලෙස අයවැය හොඳින් කියවීමේ දී තේරුම් යනවා. සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරියට ගෙන යන අයවැයක් ලෙස මෙය හැඳින්විය හැකියි. යටිතල පහසුකම් සංවර්ධනය සම්බන්ධයෙන් අයවැයෙන් හොඳ කියවීමක් තිබෙනවා.

**නුවරඑළිය දිස්ත්‍රික් මන්ත්‍රී නිමල් පියතිස්ස මහතා (පොපෙ) :-**

ජනපති මෙන්ම ආණ්ඩුව නිදහසේ රටට යමක් කරන්නට උත්සාහ කළත් ඒ හැමවිටම කොරෝනා ඊට බාධාවක් වෙනවා. මෙවර ජනතා අයවැයක් ඉදිරිපත් කර තිබෙනවා. ග්‍රාම නිලධාරී වසමකට මිලියන තුන බැගින් ලබා දී තිබෙනවා. ආර්ථික අර්බුද තිබුණත් ගමේ යෝජනා ගෙන අයවැයක් සකසන්න හැකිවී තිබෙනවා. කාබනික පොහොර ප්‍රශ්නය නිසා ගොවි ජනතාව අපහසුතාවට පත්ව තිබෙනවා. කාබනික පොහොර මෙරට කවුරුවත් ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. ගොවියන්ගේ බරපතළ ගැටලුව ගැන නැවත නැවතත් අවධානය යොමුකර මූලිකව අවශ්‍ය පොහොර ගොවීන්ට ලබා දී ක්‍රමිකව කාබනික පොහොර සංකල්පයට ළඟා වෙමු යැයි මා යෝජනා කරනවා. සහල්, ආහාර, එළවළු හිඟය ක්‍රමිකව පැමිණියහොත් ඉදිරියේදී තවත් අභියෝග ඇති වේවි.

**පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය අමාත්‍ය රොෂාන් රණසිංහ මහතා:-**

මේ රටේ ආර්ථික පරිහානියට වගකිව යුත්තේ යහපාලන ආණ්ඩුව සහ ඊට සහාය දුන් අයයි. 8.2ට තිබුණු ආර්ථික වර්ධන වේගය යහපාලනය විසින් 2.5 දක්වා පහත දැමූ විට ජනතාව ඒ අය පන්නා දැමුවා. අද සමගි ජන බලවේගය ගැන ජනතාවට කිසිම විශ්වාසයක් නැහැ. රාජපක්ෂවරුන් රට රකින බව ජනතාව දන්නවා. එද අලිමංකඩවල ගෙවල් හැදුවා. නිවාස සංවර්ධන අධිකාරියේ අරමුදල් විනාශ කළා. සංස්කෘතික අරමුදල නැති හංගස්ථාන කළා. පසුගිය කාලයේ යහපාලනය පන්නන්න මූලික වුණේ ගොවි ජනතාවයි. ගොවීන් රකින වගකීම අපට කිසිවකුත් ඉගැන්විය යුතු නැහැ. එමෙන්ම කිසිදිනක පොදුජන පෙරමුණ දමා ගොවීන් යන්නේ නැහැ. බය නැතුව කුඹුරට බසින්නැයි අප පවසනවා.

(හරිනි අමරසූරිය මහත්මිය මුලසුනට පැමිණේ)

**කෑගල්ල දිස්ත්‍රික් මන්ත්‍රී කබීර් හෂීම් මහතා (සජබ) :-**

මේ වනවිට රාජ්‍ය ආදායම් කඩා වැටෙමින් තිබෙනවා. රට උපයනවාට වඩා වියදම් කරනවා. නිෂ්පාදනය කරනවාට වඩා පරිභෝජනය කරනවා. මූල්‍ය අසමතුලිතතාවයට විසඳුමක් දෙන්නට රජය අසමත් වී තිබෙනවා. මේ ආණ්ඩුව දුවන්නේ එද වේල ටුවර්ස් ආණ්ඩුවක් ලෙසයි. රට පාලනය කරන්නේ අවුල් හවුලක් බව කිව යුතුයි. හරියට වියපත් මිත්තනියක් හේනෙන් එකතු කරගන්නා පලා වට්ටියක් වගේ. අද සුළු ජාතීන් පෙන්වමින් තමන්ගේ නොහැකියාව වසා ගන්නට උත්සාහ කරනවා.

**ගාල්ල දිස්ත්‍රික් මන්ත්‍රී ඉසුරු දෙඩන්ගොඩ මහතා (පොපෙ) :-**

නිෂ්පාදන ආර්ථිකයට යොමුවීමේ වැඩපිළිවෙළ මේ අයවැයෙන් ශක්තිමත් කර තිබෙන බව කිව යුතුයි. එමෙන්ම තරුණ තරුණියන් ව්‍යවසායකයන් බවට පත් කිරීමේ උත්තේජනයක් මෙයින් ලබා දී තිබෙනවා. වැවිලි බෝග කටයුතු ප්‍රවර්ධනය වෙනුවෙන් අයවැයෙන් රුපියල් මිලියන 10,000 ක් වෙන් කර තිබෙනවා. දේශීය ගෘහ කර්මාන්ත රැක ගැනීම අනාගතවාදී දැක්මක් සහිතව කළ ක්‍රියාවක් බව කිව යුතුයි.

**කළුතර දිස්ත්‍රික් මන්ත්‍රී ලලිත් එල්ලාවල මහතා (පොපෙ) :-**

කිසි කලෙක නොවූ පරිදි ඇති නැති පරතරය වැඩි වෙමින් තිබෙනවා. එමෙන්ම රටවල් අතර ද්විපාර්ශ්වික උපකාර ද නැති වී තිබෙනවා. මේ තත්ත්වය යටතේ ජනතාවාදී අයවැයක් ඉදිරිපත් කරන්නට හැකියාව ලැබේවි යැයි අපවත් සිතුවේ නැහැ. නමුත් මේ අයවැය මගින් බැසිල් රාජපක්ෂ මහතා හොඳ ආර්ථික කළමනාකාරකයෙක් බව පෙනී ගොස් තිබෙනවා. අප රටේ සිටි මුදල් අමාත්‍යවරුන් අතරින් දක්ෂතම මුදල් අමාත්‍යවරයා බැසිල් රාජපක්ෂ බව මා ආඩම්බරයෙන් ප්‍රකාශ කරනවා.

**කලාපීය සහයෝගිතා රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මහතා:-**

කොරෝනා නිසා මේ අවිනිශ්චිත යුගයක්. මේ තත්ත්වය යටතේ සැලසුම් සෑදීම අසීරු කාරණයක් වුවත් අභියෝග මොනවාදැයි මුදල් ඇමැතිවරයා හඳුනාගෙන තිබෙනවා. කෙටිකාලීන අවශ්‍යතා සහ දිගුකාලීන ඉලක්කවල යම් පරස්පරයක් තිබෙන බව පේනවා. දේශීය ආර්ථිකය නගාසිටුවීම සඳහා අපට මුදල් වියදම් කරන්නට සිදු වෙනවා.

**පත් කළ මන්ත්‍රී මහාචාර්ය චරිත හේරත් මහතා (පොපෙ) :-**

අයවැයක් යනු ආර්ථිකය සහ දේශපාලනය යන දෙකම එකට ගැට ගැසුණු මැදිහත්වීමක්. අයවැය ඒ අර්ථයෙන් තේරුම් ගැනීම ඉතා වැදගත් වෙනවා. මෙය දේශපාලන අභියෝග සමඟ ගැටගැසුණු අයවැයක් ලෙස පිළිගන්නැයි අප ඉල්ලා සිටිනවා. අපේ ආර්ථිකය අවුරුදු 72 ක සිට අර්බුදයක ගැට ගැසී තිබෙනවා. කොරෝනා නිසා ඒ අර්බුදය තවත් වැඩි වුණා. අපට බරපතළ රාජ්‍යයක් නඩත්තු කරන්නට සිදුවී තිබෙනවා. අප රටේ රාජ්‍ය ව්‍යාපාරවල සමහර දේවල් සුදු අලියෙක් බවට පත්ව තිබෙනවා. රාජ්‍ය ව්‍යාපාර තිස්දෙකක් රටට අලාභ ලබා දෙනවා. අලාභ ලබන රාජ්‍ය ව්‍යාපාර පද්ධතිය අරගෙන යන්න සෑම රජයකටම සිදුවී තිබෙනවා.

**කොළඹ දිස්ත්‍රික් මන්ත්‍රී මුජිබුර් රහුමාන් මහතා (සජබ) :-**

අද වනවිට රටේ පහළ පන්තියේ ජනතාව ඉතා අසීරු අඩියකට රජය විසින් පත් කර තිබෙනවා. යම් රජයකට ආර්ථිකය පාලනය කරන්නට නොහැකි නම් ඒ ආණ්ඩුව ජනතාව පෙළන ආණ්ඩුවක් බව ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා ග්‍රන්ථයක් රචනා කරමින් සඳහන් කරනවා. එතුමාගේ නිර්ණායක අනුව ම මෙය ජනතාව පෙළන ආණ්ඩුවක් බව කිව යුතුයි. එතුමා එලෙස පොත් ලියා අද ආණ්ඩුව ආරක්ෂා කරන්න කටයුතු කරනවා. එතුමා එද අපට උසස් පෙළ ආර්ථික විද්‍යාව උගන්වන කොට දැන් කරන දේශනා නම් ඉගැන්නුවේ නැහැ. වියත්මග නිසා අද මුළු රටම මහ මග නැවතිලා.

(ශානක්කියම් රාසමාණික්කම් මහතා මුලසුනට පැමිණේ)

**මාතලේ දිස්ත්‍රික් මන්ත්‍රී නාලක බණ්ඩාර කෝට්ටෙගොඩ මහතා (පොපෙ) :-**

අප ආණ්ඩුව ගෙන මාස හයක් යන විට මෙරට ජාතික ආරක්ෂාව තහවුරු කළා. කොරෝනා මර්දනය කරගෙන එන විට අලුතින් රැළි ඇති කරන්නට විපක්ෂය කටයුතු කළා. ගොවි උද්ඝෝෂණ ඇති කරන්න උත්සාහ කළා.

**කුරුණෑගල දිස්ත්‍රික් මන්ත්‍රී අසංක නවරත්න මහතා (පොපෙ) :-**

යහපාලනය අපට බාර දුන්නේ කඩා වැටුණු ආර්ථිකයක්.එන්නත්කරණයෙන් පළමු ස්ථානයට පැමිණීමට අපට හැකි වී තිබෙනවා. අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ඉහළ යාම නිසා ජීවන වියදම වැඩි වූ බව පිළිගත යුතුයි. මේ තත්ත්වය තේරුම් ගෙන අයවැය ප්‍රකාශනය ඉදිරිපත් කර තිබෙනවා.

**බදුල්ල දිස්ත්‍රික් මන්ත්‍රී මේජර් සුදර්ශන දෙනිපිටිය මහතා (පොපෙ) :-**

මේ විපක්ෂයේ බලාපොරොත්තු සුන් වූ අයවැයක් බව කිව යුතුයි. අද විපක්ෂය ඉතිහාසය නොදන්නා සේ කතා කරනවා. අපේ රටට මේ තත්වය උදා වී ඇත්තේ ලොසින්ජර් ආර්ථික න්‍යාය නිසයි. නමුත් ඒ තත්ත්වය නැති කිරීමට මේ අයවැයෙන් අපට හැකි වී තිබෙනවා. අප දුර බලා මේ අයවැය ඉදිරිපත් කර තිබෙනවා.

**අනුරාධපුර දිස්ත්‍රික් මන්ත්‍රී එච්. නන්දසේන මහතා (පොපෙ) :-**

දිගුකලක් ආණ්ඩු කරගෙන ගිය අයගේ අමනෝඥ තීරණ නිසා වත්මන් අර්බුද ඇති වී තිබෙනවා. අමුඩ ලේන්සුවත් රටෙන් ගෙන එන යුගයක් තිබුණා. මෙරට නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ පවා රටින් ගෙනාවා. භාණ්ඩ හයසිය ගණනක් මෙරටට ගෙන්වීම තහනම් කළේ ඒ නිසයි. මෙවර අයවැය ඉදිරිපත් කිරීම සඳහා සෑම ග්‍රාම සේවා වසමකින්ම යෝජනා ලබා ගත් බව කිව යුතුයි. අප ප්‍රදේශයට පොහොර ලබා දීමේදී කාබනික ද රසායනික ද කියා ලොකු ප්‍රශ්නයක් නැහැ. ලැබෙන දේ කලට වේලාවට ලබා දෙන්නැයි අප ඉල්ලා සිටිනවා.

**මහනුවර දිස්ත්‍රික් මන්ත්‍රී වසන්ත යාපා බණ්ඩාර මහතා (පොපෙ) :-**

දෙවන ලෝක යුද්ධයෙන් පසු දරුණු ආර්ථික අවපාතයක් වන පළමු අවස්ථාව මෙයයි. දරුණු ව්‍යසනයක් හමුවේ ආර්ථිකය කළමනාකරණය කරන්නට ආණ්ඩුවට සිදු වී තිබෙනවා. ලෝකයේ භාණ්ඩ මිලට සමානුපාතිකව ගත් කල ලංකාවේ භාණ්ඩ මිල ඉහළ ගොස් ඇතැයි කියන්න බැහැ. ගෑස්, කිරිපිටි, පරිප්පු, සීනි සියලුම දේවල්වල ලෝක මිල ද අදහා ගන්නට බැරි පරිදි ඉහළ ගොස් තිබෙනවා. කොරෝනා වසංගත තත්ත්වය ඊට හේතු වී තිබෙනවා. ආසියාවේ දැනුමේ කේන්ද්‍රය බවට ශ්‍රී ලංකාව පත් කිරීමට කටයුතු කර තිබෙනවා.

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මන්ත්‍රී කපිල අතුකෝරළ මහතා (පොපෙ) :-**

මෙය සෞභාග්‍යයේ දැක්ම යථාර්ථයක් කරන අයවැයක් බව කිව යුතුයි. රාජපක්ෂවරුන් හැමවිටම රට භාර ගත්තේ ඉතා අපහසු යුගයන්වලදීයි. 2005 වසරේ දී මහින්ද රාජපක්ෂ මහතා බලයට ආවේ නැතිනම් මේ කතා කරන අපත් ජීවතුන් අතර නැති බව කිව යුතුයි. ජාතිවාදී අන්තවාදී අදහස් ඇතිව දේශපාලනය කරන කඳවුරු විපක්ෂය පැත්තේ තවමත් සිටීම කනගාටුවක්.

**කොළඹ දිස්ත්‍රික් මන්ත්‍රී ජගත් කුමාර මහතා (පොපෙ) :-**

ශක්‍රයාගේ පුතා වයිමා ආවත් ජනතාවට සහන දෙන්න බැරි බව බොහෝ අය කිව්වා. එවැනි වකවානුවක සාධනීය අයවැයක් ඉදිරිපත් කරන්න මුදල් ඇමැති සමත් වුණා. බොහෝ දෙනා අයවැය විවේචනය කරන්නේ උඩින් අත පත ගාලා. එමෙන්ම මල නොතලා රොන් ගන්නවා වගේ බදු අය කරන ගමන් පොඩි මිනිහට සහන දී තිබෙනවා.

**(පාර්ලිමේන්තුව අද (15) පෙරවරු 9:30ට රැස් වේ.)**

# රට කනකොට තමුන්නාන්සෙ කොහෙද හිටියේ?

(සුපිත් හේවාජුලිගේ)

**සමගි ජන බලවේගයේ කොළඹ දිස්ත්‍රික් මන්ත්‍රී මුජිබර් රහුමාන් මහතා අයවැය විවාදයට එක්වෙමින් ආණ්ඩුව දැඩි ලෙස විවේචනය කළේ මෙරට බිහිවූ අසාර්ථකම ආණ්ඩුව මෙය බව පවසමිනි. මේ අවස්ථාවේදී මුජිබර්ට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් එල්ලවූයේ ගල්මුල් මිස මල්වැල් නම් නොවෙයි. මුජිබර් ලොකු බාධා මැද දිගටම කතා කරගෙන ගියේය.**

"මේ ආණ්ඩුව සම්පූර්ණයෙන්ම අසාර්ථකයි කියලා කියන්නේ වෙන කවුරුවත් නොවෙයි. ආණ්ඩුවේම මන්ත්‍රීවරුන්. දැක්කද පසුගිය දවසක අනුර ප්‍රියදර්ශන යාපා මන්ත්‍රීතුමා කරපු කතාව. ඔහු කිව්වා මේ කැබිනට් මණ්ඩලය අසාර්ථකම එක කියලා. මේ ආණ්ඩුව යන්නේ කොහෙද මල්ලේ පොල් කියලත් ඔහු කිව්වා. මේවා දකිනකොට ආණ්ඩුව අසාර්ථකයි කියලා අපි කියන්න ඕනෙ නැහැ. ඒවා අද ආණ්ඩුවේම මන්ත්‍රීවරුන් කියනවා. ඔන්න ඕක තමයි ඇත්ත තත්ත්වය." යැයි මුජිබර්

පැවසුවේ සුපුරුදු ප්‍රවේගාත්මක ස්වරයෙනි.

"එතකොට ගිය ආණ්ඩුව සාර්ථකම ආණ්ඩුවද"

ඒ හඬ ආණ්ඩුවේ මන්ත්‍රීවරයකුගේය.

මේ අවස්ථාවේදී මුජිබර්ට පිළිතුරක් දීමට නැගී සිටි ජොන්ස්ටන් ප්‍රනාන්දු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා පැවසුවේ අමුතු කතාවකි.

"ඔබතුමා එතුමා වෙනුවෙන් පෙනී සිටිනවා වගෙයි. ඒකට කමක් නෑ. ඔව් ඉතින් එතුමා ඔබතුමාගේ ආණ්ඩුවේත් හිටපු කෙනානේ. ඒනිසා එතුමා හොඳ නම් අරගෙන ඇමැතිකමක් දෙන්න." ජොන්ස්ටන් පැවසුවේ උපහාසාත්මක සිනාවක්ද මුව රඳවාගෙනය.

මුජිබර්ගේ කතාව අවසන් නැත. ඔහු ඊළඟට හැරුණේ මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ දෙසටය.

"බැසිල් ඇමැතිතුමා ආවේ මහා ලොකු දේවල් කරනවා කියලයි. ඒත් අද වනතුරු කරපු දෙයක් නැහැ. අයවැයෙනුත් එතුමා ෆේල්. බැසිල්ට මුදල් ඇමැතිකම දුන්න එක හරියට වක්කඩේ හකුරු හැංගුවා වගේ වැඩක්" මුජිබර් කියාගෙන කියාගෙන ගියේ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ගේ දෙස් දෙවොල් මධ්‍යයේය.

වෙළෙඳ අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන අයවැය විවාදයේදී අදහස් දක්වමින් සිටියදී විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් වරින්වර එල්ලවූ බාධා නම් අඩුවක් නොවීය.

මේ අවස්ථාවේදී ආචාර්ය හර්ෂ ද සිල්වා ද බන්දුලට යමක් කීවේය.

බන්දුලට යකා නැග්ගේය.

"මේගොල්ල රට කාපු අය. රට කනකොට තමුන්නාන්සේ කොහෙද හිටියේ. දැන් ඉතින් මෙතන දේශපාලන කතා පවත්වන්න පුළුවන්." යැයි බන්දුල පැවසුවේ යටිගිරියෙනි.

හර්ෂ ඉන් එහාට බන්දුලට බාධා කිරීමට ගියේ නැත.

ආචාර්ය හර්ෂ ද සිල්වාද අය වැය ගැන කතා කරමින් එය දැඩි ලෙස විවේචනය කළ අවස්ථාවේදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් එල්ල වූයේද දැඩි බාධාවකි.

"මේ අයවැය බොරුවක් පුස් ලියවිල්ලක්. දැන් බලන්න අයවැය විවාදය යන්නේ. කෝ බැසිල් ඇමැතිතුමා. එතුමා නෑ. අඩු තරමින් එතුමට මුල් දවසෙවත් විවාදයට සහභාගි වෙන්න සදාචාරයක් තිබුණා." හර්ෂ චෝදනා කළේය.

මෙහිදී නැගී සිටි ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ "එතකොට ඕගොල්ලන්ගේ විපක්ෂ නායකතුමා ඉන්නවාද" යැයි විමසුවේ උපහාසාත්මක ස්වරයෙනි.

හර්ෂට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ බාධා එන්න එන්නම වැඩිවිය.

මෙහිදී හර්ෂ වෙනුවෙන් පෙනී සිටි ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීවරයා "මේ අයවැය විවාදයේ විපක්ෂයේ පළමු කතාව. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව ඒකට බාධා කරන්න බැහැ. ඒක ඔබතුමාල දැනගන්න ඕන." ඉරාන් කීවේ මුලසුන දෙසද බලමිනි.

සමගි ජන බලවේගය රත්නපුර දිස්ත්‍රික් මන්ත්‍රී හේෂා විතානගේ සභාවේ කටයුතු ආරම්භයේදී ප්‍රශ්නයක් මතු කළේ අමාත්‍ය චමල් රාජපක්ෂගෙනි.

ඇමැති ඊට පිළිතුරු දීමට පෙර කීවේ වෙනත් කතාවකි.

"ඕවා හැබැයි ඔබතුමාලා ආණ්ඩුවේ ඉදිද්දි නම් පෙනුණේ නැහැ. දැන් තමයි ඕවා පේන්න අරන් තියෙන්නේ"

චමල් කී ඒ කතාවට බොහෝ දෙනකුට සිනාය.

ජනතා විමුක්ති පෙරමුණේ විජිත හේරත්ටද අයවැය ගැන තිබුණේ බරපතළ විවේචනයකි. ඔහු අයවැය යෝජනාවලිය දැඩි ලෙස විවේචනය කළේ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ගේ බාධා මධ්‍යයේය.

"බැසිල් එනකොට එද කිව්වේ මොළ හතේ ඇමැති එනවා කියලයි. මොකක්ද මේ මොළ හතේ ඇමැතිගේ අයවැය. මේක මොළ හතේ සහගතය" යැයි ඔහු කීවේය.

මාතර වීරසුමන වීරසිංහ ආණ්ඩු පක්ෂයේම මන්ත්‍රීවරයෙකි. ඔහු අයවැය යෝජනාවලියේ එක් යෝජනාවක් ගැන කතා කළේ නම් තරමක් නොමනාපයෙනි.

ඒ රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම වයස 65 දක්වා දීර්ඝ කිරීමේ යෝජනාව ගැනය.

"රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම වයස 65 දක්වා දීර්ඝ කිරීම එතරම් හොඳ දෙයක් නොවෙයි. කාර්ය සාධනය හොඳ අයට ඒ අවස්ථාව දුන්නට කමක් නෑ. නමුත් හැමෝටම ඒක දීමෙන් තරුණ පරපුරට රාජ්‍ය සේවයට එන්න තියෙන අවස්ථාව ඇහිරෙනවා." වීරසුමන කීවේ තරමක් බිඳුණු හඬිනි.

